# නියමුවා

> "සමාජමය නිෂ්පාදනය සහ බෙදා හැරීම විද්‍යාත්මක මාර්ගයක් අනුව පුළුල් ලෙස ව්‍යාප්ත කිරීමට ඒවා වැඩ කරන ජනතාවගේ ජීවිතය පහසු කිරීමේ සහ හැකි තරම් දුරට ඔවුන්ගේ යහ සාධනය වැඩි දියුනු කිරීමේ අරමුණාට යටත් කිරීමටත් ඉඩ සලසන්නේ සමාජවාදය පමණකි. මෙය ඉටු කළ හැක්කේ සමාජවාදයට පමණකි. එසේම, සමාජවාදය මෙය ඉටු කළ යුතු බවද අපි දනිමු."
>
> ලෙනින්
> තෝරාගත් කෘති,
> 08වැනි වෙළුම,
> 134පිටුව

ISSN 1391 - 1031 2021 ඔක්තෝබර් - විද්‍යුත් මුද්‍රණය ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

# ආහාර සුරක්ෂිතතාව අනතුරේ
# ගොවියාත් පාරිභෝගිකයාත් බේරාගැනීමට
# ආණ්ඩුව වහා මැදිහත් විය යුතුයි

## ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා

ජනතාවගේ ප්‍රධානතම ආහාරය හා බැඳී තිබෙන වී මිලදී ගැනීමේ සහ සහල් වෙළඳපොළේ ඒකාධිකාරිය බිඳ දැමිය යුතු බවත් එය ආණ්ඩුව කළ යුතුව ඇත්තේ ඒකාධිකාරිය බිඳ තරගකාරිත්වයක් ඇති කිරීම බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණ, රටේ අභියෝගයට ලක්වී ඇති ආහාර සුරක්ෂිතාව ආරක්ෂා කර ගැනීම සඳහා වහා රජයේ මැදිහත්වීමක් සිදුවිය යුතුව ඇති බව අවධාරණය කළේය.

ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා මේ බව ප්‍රකාශ කළේ පසුගිය 29වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"ආණ්ඩුව නියෝජනය කළේ ගොවි ජනතාවගේ පැත්තවත් දෙකෝටියකට අධික බත් කන ජනතාවගේ පැත්තවත් නොවෙයි. ආණ්ඩුව හැමදාම නියෝජනය කරන්නේ මාෆියාකාරයන්වයි. අනෙක් පැත්තෙන් මාධ්‍ය සංදර්ශනවලින් රටක් පාලනය කරන්න බැරි බව ඔප්පු කර තිබෙනවා. මේ පාලකයන්ට ඒ පිළිබඳ දැක්මක් හෝ ඕනෑකමක් නැහැ. මේ තත්වය තුළ අසරණ වෙන්නේ අපේ රටේ පොදු ජනතාවයි.

ආණ්ඩුව කිරිපිටි, සුදුළූණු, පරිප්පු වගේ ආනයනික අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යෑම අපිට පාලනය කරන්න බැහැ කියනවා. එහෙම නම් හාල් මිල ඉහළ ගියේ ඇයි? අපේ රටේ නිෂ්පාදනයක්, රුපියල්වලින් ගනුදෙනුකරන භාණ්ඩයක් වෙලත් මිල ඉහළ ගියේ මේ පාලකයන්ට දැක්මක් සහ වැඩපිළිවෙළක් නොමැති නිසයි. ජනාධිපතිවරයාත් ඔහුටම හරියන කෘෂිකර්ම ඇමතිවරයාත් මේ ක්ෂේත්‍රය මුළුමනින්ම අවුල් ජාලාවක් බවට පත්කර තිබෙනවා. ජනාධිපතිවරයා ඇගෙන් සහ කෘෂිකර්ම අමාත්‍යවරයා කටෙන් මෙහෙයවීමේ ප්‍රතිඵල හැටියට මෙවැනි වියවුලක් නිර්මාණය කර තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂ බලයට පත්වෙන්න කලින් ඔහු සම්බන්ධයෙන් විශාල ප්‍රතිරූපයක් සහිත ප්‍රබන්ධයක් ගොඩනැගුවා. දැන් අයිස් කන්දක් දියවෙනවා වගේ සැබෑ ස්වභාවය හෙළිවෙමින් තිබෙනවා.

අනෙක් පැත්තෙන් රසායනික යෙදවුම් එක රැයින් නතර කිරීම නිසා කෘෂිකර්මාන්තයට වෙන හානිය අපි දිගින් දිගටම පෙන්වා දී තිබෙනවා. රසායනික යෙදවුම්වල ඉඳලා කාබනික යෙදවුම් දක්වා පරිවර්තනය වෙන්න අනිවාර්ය සංක්‍රමණීය කාලපරිච්ඡේදයක් ඕනෑ. නමුත් අපේ රටේ මහ කන්නයේ තීන්දුවක් අරගෙන යල් කන්නයේ සිට ක්‍රියාත්මක කරනවා. මේ නායකයන් ජාත්‍යන්තර සමුලුවලට ගිහින් තමන්ගේ ප්‍රධාන වැඩේ එය බවට පුරසාරම් දොඩවනවා. අද වෙනකොට කාබනික පොහොර නිෂ්පාදන සැලසුම් සියල්ල අසාර්ථක වී ඒවා ආනයනය කිරීමට සූදානම් වෙනවා.

ඒ අනුව ගෙන්වූ කාබනික සාම්පල්වල අර්වේනියා සහ බැසිලස් කියන ඉතාමත් හානිකර බැක්ටීරියා තිබෙන බව ශාබ නිරෝධායන සේවයෙන් හොයා ගත්තා. ඒ අවස්ථාවේ කෘෂිකර්ම ඇමතිවරයා පෙනී සිටියේ තමන්ගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ශාබ නිරෝධායන සේවය වෙනුවෙන් නෙවෙයි. චීනයෙන් ගෙනෙන කැලිකසල සමාගම්කාරයාගේ පැත්තයි. හරිනම් විෂ සහිත පොහොරක් ලංකාවට පැමිණීම වැළැක්වීමේ පරීක්ෂණ කළ නිලධාරීන්ට ස්තුති කරන්න ඕනෑ. හැබැයි ඒ වෙනුවට ඇමතිවරයා කුමන්ත්‍රණයක් තියෙන බවට සී.අයි.ඩී.යට පැමිණිලි කරන බව කියා තිබුණා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බොහෝ නිලධාරීන්, ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥයින්. ඔවුන් විෂ සහිත කාබනික පොහොර ගෙන්වීම වැළැක්වීම සඳහා විශාල හඬක් නැගුවා. අපි ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ පොදු ජනතාව, අපේ මාතෘභූමියේ පැත්ත ගැනීමෙන් විශාල විනාශයක් වීම වැළැක්වුණා.

ඔක්තෝබර් මැද වනවිට මහ කන්නයේ වී වගාව ආරම්භ කරනවා. ඒ වෙනුවෙන් කාබනික පොහොර දෙන්න ආණ්ඩුව සතුව කිසිදු සැලැස්මක් නැහැ. අපි දිගටම කීවේ ගොවියෝ කෘෂිකර්මාන්තය අත්හැරීම වගේම විශාල ආහාර හිඟයක් ඇති වෙන බවයි. ඩොලර් නැති නිසා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පවා වරායෙන් ගොඩබා ගන්න බැරිවෙලා තියෙනවා. නමුත් එහෙම තිබියෙදී හාල් පිටරටින් ගේන බව ආණ්ඩුව කියනවා. රටක ආහාර සුරක්ෂිතතාව විනාශ කර ඩොලර් පතුලටම හිඳී තිබෙන වෙලාවක මේ පාලකයන් කිසිදු වගකීමකින් තොරව අපරාධකාරී ක්‍රියාමාර්ග අනුගමනය කර තිබෙනවා. සාමාන්‍යයෙන් දවසකට සහල් මෙ.ටොන් 6,500ක් අවශ්‍ය වෙනවා. එවැනි තත්වයක ආණ්ඩුව සහල් මෙ.ටොන් ලක්ෂයක් ගේන බව කියනවා. අවුරුද්දේ දින 365න් දින 15කට ප්‍රමාණවත් සහල් ආනයනය කර ප්‍රශ්නය විසඳන බව ආණ්ඩුව කියනවා.

මේ පාලකයන් කිසිම අවබෝධයක් නැති අසාර්ථකම පාලකයන්. 20වැනි සංශෝධනය, 2/3 බලය, හදිසි නීති රෙගුලාසි ඇතුළු අධිකාරී බලය සහිත පාලකයන් පත්කිරීමේ ප්‍රතිවිපාකවලට ජනතාව මුහුණපා සිටිනවා. මේ වනවිට ගොවියන් සහ පාරිභෝගික ජනතාව පත්වී තිබෙන අසීරු තත්වයෙන් මුදා ගැනීමට වේගයෙන් මැදිහත්වීම් කළ යුතු බව අපි ආණ්ඩුවට අවධාරණය කරනවා."

## කොවිඩ් සහන සේවා මෙහෙයුම




## 03
### ගැසට් රිවස්...



මුදල් හිඟයක් පවතින ඒ නිසා විදේශවලින් ආනයනය කළ යුතු අත්‍යවශ්‍ය භාණ්ඩ පවා ආනයනය සීමා දමා තිබෙන වෙලාවක සහල් ආනයනය කිරීම මෝඩකමකි.

## 04
### විසඳුම ඇත්තේ...



ජනතාව දැන් ඉන්නෙ නිදහස සහ අයිතිවාසිකම් දිනාගැනීමේ අරගලයක. සමාජ විමුක්තිය වෙනුවෙන් කරන අරගලයක. අත්අඩංගුවට ගනිල්ලා, හිරේ දාපල්ලා. අපි ලෑස්තියි කියන තැනට ජනතාව ආවට පස්සෙ....

## 06
### සංචිත අර්බුදය...



ආර්ථිකය හැදීමට ඇති වැඩපිළිවෙළ දේශපාලනය හැදීමට ඇති වැඩපිළිවෙළේම කොටසක් ලෙස තේරුම් නොගෙන, මේ ජරාජීර්ණ දේශපාලන ක්‍රමය මෙලෙසම පවත්වා ගනිමින් ආර්ථිකය වෙනස් කළ හැකියැයි සිහින මැවීම තවදුරටත් පළක් නැත....

සටන් බිම........................ 02
ජාත්‍යන්තර...................... 05
කාලීන.......................... 08
විශ්ලේෂාංග...................... 09
ඉතිරි.................................. 10


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# සටන් බිම

## වැඩකරන ජනතා ජයග්‍රහණ ඉදිරියට ගෙනයාමට දැවැන්ත සංවිධානයක් හදනවා...



### ලාල්කාන්ත සහෝදරයා

'ජන ජීවිතය බිල්ලට දෙන ආණ්ඩුව හමුවේ වෘත්තීය සමිති වගකීම' මැයෙන් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය මගින් පසුගියදා Online ජාතික රැලියක් පැවැත්වූ අතර එහිදී ලාල්කාන්ත සහෝදරයා ඇතුළු සෞඛ්‍ය වෘත්තීය සමිති නායකයෝ එම රැලිය ඇමතූහ. මෙහිදී ලාල්කාන්ත සහෝදරයා පැවසුවේ දැනට රට පත්වී ඇති විනාශයෙන් නැගිටීම සඳහා වෘත්තීය සමිති ඇතුළු වැඩකරන ජනතාවට සුවිශාල කාර්යභාරයක් ඇති බවත් ඔවුන් සියලුදෙනා එක්ව ඒ සඳහා පෙරමුණ ගත යුතු බවත්ය. එමෙන්ම වෘත්තීය සමිති ව්‍යාපාරයේ මූලිකත්වයෙන් ලබාගත් ජයග්‍රහණ ඉදිරියට ගෙනයාම වෙනුවෙන් වැඩකරන ජනතාව මූලිකත්වයෙන් දැවැන්ත සංවිධානයක් ගොඩනගන බවද ඔහු පැවසීය.

එසේම ආණ්ඩුවේ ජනතා ද්‍රෝහී වැඩ පරාජය කිරීමට වෘත්තීය සමිති ව්‍යාපාරයට හැකි වූ බව පෙන්වා දුන් ලාල්කාන්ත සහෝදරයා විදේශ ජාවාරම්කාරයන්ට වරාය නැගෙනහිර ජැටිය විකිණීමට උත්සාහ කළ මොහොතේ සියලු වෘත්තීය සමිති එකතු වී වැඩවර්ජන ක්‍රියාමාර්ග ගැනීමෙන් ආණ්ඩුවට අඩිය පිටුපසට ගැනීමට සිදු වූ බව කියා සිටියේය.

මෙම ජාතික රැලියේදී සමස්ත ලංකා සෞඛ්‍ය වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති නීතිවේදී සමන්ත කෝරලේආරච්චි, සමස්ත ලංකා වෛද්‍ය නිලධාරී සංගමයේ ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර, සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය නිලධාරී සංගමයේ සංවිධායක ලේකම් ආයුර්වේද වෛද්‍ය නිලන්ත බණ්ඩාර, සමස්ත ලංකා හෙද සංගමයේ ලේකම් හෙද නිලධාරී එස්.බී. මැදිවත්ත, සමස්ත ලංකා වාට්ටු ලිපිකරු සංගමයේ ලේකම් රේණුකා ලියනගේ, සමස්ත ලංකා සුවසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ගුරුගේ යන සහෝදර සහෝදරියෝ රැලිය ඇමතූහ. මෙම ජාතික රැලිය සමස්ත ලංකා හෙද සංගමයේ සභාපති හෙද නිලධාරී ප්‍රභාත් පලිපාන විසින් මෙහෙයවනු ලැබිණි.

## කලාප සේවක ජීවිත දැඩි අවදානමක බලධාරීන්ගෙන් විසඳුම් නැහැ...



### ගාමිණී රත්නායක සහෝදරයා

මේ වෙනවිට කලාප සේවකයින් බොහෝ පිරිසක් කොවිඩ් වසංගතය ආසාදනය වී ඇති බවත් බොහෝ පිරිසකට තම බෝඩිම්වලම නිරෝධායනය වීමට සිදුව ඇති බවත් මේ තත්වය තුළ කලාප සේවක සේවිකාවන්ගේ ජීවිත දැඩි අවදානමකට ලක්වී ඇති බවත් වෙළඳ කලාප සේවකයින්ගේ ජාතික මධ්‍යස්ථානයේ කැඳවුම්කරු ගාමිණී රත්නායක සහෝදරයා පැවසීය. එසේම ආයෝජන මණ්ඩලයේ බලධාරීන් හෝ කම්කරු කොමසාරිස්වරයා මේ සම්බන්ධයෙන් කිසිදු විසඳුමක් මෙම කලාප සේවකයින්ට ලබා දී නොමැති බවද ඔහු වැඩිදුරටත් පෙන්වා දුන්නේය. ඔහු මේ බව පැවසූයේ මේ සම්බන්ධයෙන් අදහස් පළකරමින් පැවැත්වූ මාධ්‍ය හමුවක් අමතමිනි.

රටට ඩොලර් ලබාදෙන ප්‍රධාන ආදායම් මාර්ගය බවට පත්වී තිබෙන වෙළඳ කලාප ආශ්‍රිත නිෂ්පාදන බව කියා සිටි ඔහු මහ බැංකු වාර්තාවට අනුව 2021 අවුරුද්දෙ පළමුවන කාර්තුවෙ ඇ.ඩො.මිලියන 300කට ආසන්න මුදලක් වෙළඳ කලාප සේවක ශ්‍රමයෙන් රටට ලැබී ඇති නමුත් එම සේවක සේවිකාවන්ට හිමි වටිනාකම සහ ඔවුන්ගේ දායකත්වයේ තක්සේරුව මෙතෙක් ලබාදීමට වත්මන් ආණ්ඩු සමත් වී නොමැති බවද පෙන්වා දුන්නේය.

## ජාතික සම්පත් විකිණීමට එරෙහිව වෘත්තීය සමිති රැලියක්



කොරෝනා මර්දනයට විද්‍යාත්මක වැඩපිළිවෙළක් අනුගමනය නොකිරීමට, ජාතික සම්පත් විකිණීමට, බඩු මිල ඉහළ දැමීමට, ගැසට් වංගුවලට, මර්දනයට එරෙහිව වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය මගින් පසුගියදා Online ජාතික රැලියක් පැවැත්විය. මෙම සම්මන්ත්‍රණය අමතමින් එහි සම කැඳවුම්කරු වසන්ත සමරසිංහ සහෝදරයා සඳහන් කළේ කොවිඩ් මර්දනය ඇතුළු සෑම ක්ෂේත්‍රයකම ආණ්ඩුවේ අසාර්ථකත්වය වසා ගැනීම සඳහා රටේ ජනතාවගේ කටවල් වැසීමට ආණ්ඩුව පියවර ගනිමින් සිටින බවත් ඊට එරෙහිව වෘත්තීය සමිති ඇතුළු සියලු බලවේග පෙරට ගෙනඒමට කටයුතු කරන බවත්ය.

මෙම රැලිය ඇමතීම සඳහා සමස්ත ලංකා කළමනාකරණ සේවා නිලධාරීන්ගේ සංගමයේ සභාපති උදේනි දිසානායක, සංවර්ධන නිලධාරී සේවා සංගමයේ ලේකම් චන්දන සූරියආරච්චි, ජාතික සේවක සංගමයේ උප සභාපති සුනිල්ද සිල්වා, ලංකා බැංකු සේවක සංගමයේ භාණ්ඩාගාරික එච්.එම්.බී.බී. හේරත්, කම්කරු අරගල මධ්‍යස්ථානය වෙනුවෙන් සංජීව බණ්ඩාර, තැපැල් හා විදුලි සංදේශ සේවා සංගමයේ සභාපති චින්තක බණ්ඩාර, ජනතා අයිතීන් උදෙසා ජාතික එකමුතුවේ කැඳවුම්කරු තුසිත පෙරේරා, සෞඛ්‍ය වෘත්තීය වේදීන්ගේ විද්වත් සංගමයේ සභාපති රවිකුමුදේශ්, ලංකා වෘත්තීය සමිති සම්මේලනයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් චමින්ද පෙරේරා, ස්වාධීන වරාය සේවක සංගමයේ ලේකම් ලාල් බෙංගමුවගේ, රජයේ හෙද නිලධාරීන්ගේ සංගමයේ සභාපති සමන් රත්නප්‍රිය, ජාතික වෘත්තීය සමිති පෙරමුණේ සභාපති තමරා ගයානි යන වෘත්තීය සමිති නායක නායිකාවෝ සහභාගි වූහ.

## කොවිඩ් දීමනාව ඇතුළු ඉල්ලීම් වෙනුවෙන් සෞඛ්‍ය සේවක උද්ඝෝෂණ



රු. 7500/-ක කොවිඩ් දීමනාව ලබාගැනීම ඇතුළු ඉල්ලීම් ගණනාවක් වෙනුවෙන් කොළඹ ජාතික රෝහල, ජයවර්ධනපුර රෝහල, වැලිසර රෝහල, ළමා රෝහල, රත්නපුර මහ රෝහල, බොරැල්ල ආයුර්වේද රෝහල ඇතුළු රට පුරා රෝහල් ගණනාවක පසුගියදා උද්ඝෝෂණ ක්‍රියාමාර්ග ගණනාවක් පැවැත්විණි. මේ සඳහා එම රෝහල්වල හෙද හෙදියන්, වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය කාර්ය මණ්ඩල සහභාගි වූහ. කොවිඩ් දීමනාව, ආරක්ෂිත ඇඳුම්, අනුමත නිවාඩු, ගමන් පහසුකම් ලබාදීම ඇතුළු ඉල්ලීම් කිහිපයක් වෙනුවෙන් සමස්ත ලංකා සුවසේවා සංගමය ඇතුළු වෘත්තීය සමිති ගණනාවක එකමුතුවෙන් මෙම උද්ඝෝෂණ ක්‍රියාමාර්ගය සිදුකෙරිණි.

## ඔළුගෙඩි මාරු කිරීමක් වෙනුවට ආර්ථිකයේ ප්‍රතිපත්තිමය වෙනසක් සිදු විය යුතුයි

### ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා



පුටු මාරු කිරීමෙන් හෝ ඔළුගෙඩි මාරු කිරීමෙන් හෝ පැලැස්තරවලින් අර්බුද විසඳීමට නොහැකි බවත් එවැනි අමනෝඥ තීන්දුවලින් රට ගොඩනැගීමට නොහැකි බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, ආර්ථික සහ දේශපාලන ප්‍රතිපත්තිමය වෙනසක් සිදුකිරීම වෙනුවෙන් ජනතාව සංවිධානය විය යුතු බව කියා සිටියේය.

සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මෙම අදහස් පළ කළේ මහ බැංකු අධිපතිවරයා ලෙස අජිත් නිවාඩ් කබ්රාල් මහතා පත්කිරීම සම්බන්ධයෙන් මතු වී ඇති ආන්දෝලනාත්මක තත්වය පිළිබඳව කරුණු දැක්වීම සඳහා පසුගිය 14වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවේදීය. මෙහිදී තවදුරටත් අදහස් දැක්වූ සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මෙසේද පැවසීය.

" උදේ මුදල් රාජ්‍ය ඇමතිවරයා සවස මහ බැංකු අධිපති කිරීමෙන් මහ බැංකුවේ ස්වාධීනත්වය බරපතළ ලෙස ප්‍රශ්න කෙරෙනවා. කබ්රාල් පත්කරන්නේ එයාගේ තිබෙන අත්දැකීම්, දැනුම හා පලපුරුද්ද උපයෝගී කරගෙන ආර්ථිකය කඩා වැටීම නවත්වන්න බව කියනවා. විදේශ විනිමය අර්බුදය විසඳන්න කියල තියෙනවා. කඩා වැටෙන ආර්ථිකය ගොඩනගන්න රාජ්‍ය මුදල් ඇමති විදිහට දක්වපු කුශලතාවය, හැකියාව සහ පලපුරුද්ද මොකක්ද? අධිපතිවරයා හැටියට පත්වීම් ලබන අජිත් නිවාඩ් කබ්රාල් වංචනික කුප්‍රකට ඉතිහාසයක් තිබෙන කෙනෙක් මිස ආර්ථිකය ගොඩදාන්න හැකි කෙනෙක් ලෙස අපි දකින්නේ නැහැ. මහ බැංකු වෝහාරික වාර්තාවෙන් බොහෝ කරුණු හෙළි කර තිබෙනවා, අර්ථසාධක අරමුදලට පමණක් බැඳුම්කර වංචාව නිසා මිලියන 9074ක් පාඩුකර තිබෙන බව අනාවරණය කර තිබෙනවා. මේ රටේ වැඩකරන ජනතාවගේ අරමුදලට සිදුකර තිබෙන පාඩුව මොන තරම්ද කියලා මේ වාර්තාවේ දැක්වෙනවා. අර්ජුන් මහේන්ද්‍රන්, අජිත් නිවාඩ් කබ්රාල් වැනි සියලු දෙනා අධිකරණයට කැඳවන්න කියලා අපි විශාල උද්ඝෝෂණයක් ගෙනගියා.

නමුත් අර්ජුන් මහේන්ද්‍රන් ඇතුළු සියලු දෙනාට දඬුවම් දෙනවා වෙනුවට කබ්රාල් මහත්තයා නැවත මහ බැංකු අධිපති පුටුවේ වාඩි කරවා තිබෙනවා. ඥාති මිත්‍ර සංග්‍රහ නැතිව විද්‍යාත්මක පදනමක් මත තනතුරු ලබාදෙන බව කියූ අය ක්‍රියා කරන හොඳම උදාහරණය ලෙස අජිත්

10 වැනි පිටුවට

## උතුරේ දුප්පත්කම වේගයෙන් ඉහළ ගොස් තිබෙනවා

### ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයා




කොවිඩ් වසංගතය හමුවේ ආණ්ඩුව උතුරු ප්‍රදේශයේ ජනතාව පිළිබඳව යොමු කර තිබෙන අවධානය කිසිසේත් ප්‍රමාණවත් නොමැති බව ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයා, එහි දුප්පත්කම විශාල වශයෙන් වැඩිවී තිබෙන බවත් දුප්පත්කම නිසා පීඩාවට පත්වන ජනතාව කොවිඩ් වසංගතය හමුවේ බලවත් පීඩාවට පත්වී සිටින බවත් පෙන්වා දුන්නේය.

රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 14වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවැත්වූ මාධ්‍ය හමුවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් පළ කළ ඔහු මෙසේද පැවසීය.

"රටේම දුප්පත්කම 6.7%ක් හැටියට තිබුණත් කිලිනොච්චියේ 10.9%ක් වෙනවා. දුප්පත්කම නිසා පීඩාවට පත්වන ජනතාව කොවිඩ් වසංගතය හමුවේ බලවත් පීඩාවට පත්වී සිටිනවා. ඒ වගේම සමාජ ආර්ථික ප්‍රශ්න නිසා යාපනය දිස්ත්‍රික්කයේ මැර කණ්ඩායම් පවා බිහිවී තිබෙනවා. ඔවුන් මැඩ පැවැත්වීමට පොලීසිය අසමත් වී තිබෙනවා. මේ නිසා උතුරු ප්‍රදේශයේ ජනතාව නැවත වටයකින් භීතියට පත්වී සිටිනවා. තව පැත්තකින් ආර්ථික අගහිඟකම් නිසා ගණිකා වෘත්තිය වැඩි වී තිබෙනාව. සමහර ගණිකා මඩම්වලට පොලිසිය ආරක්ෂාව දෙනාවද

10 වැනි පිටුවට

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# අර්බුදයට විසඳුම අතීතයට යාමද?

මේ වනවිට ලංකාව දැවැන්ත මූල්‍ය අර්බුදයකට, විදෙස් විනිමය හිඟයකට මුහුණ දී සිටී. තත්වය කෙතරම් බරපතළද යත්, නිදහස් වෙළඳපොළ ආර්ථිකය බදාගෙන සිටින ආණ්ඩුවට ආනයන රැසක් සීමා කිරීමටද සිදුවී තිබේ. ආනයන සීමා කිරීම නිදහස් වෙළඳපොළ ආර්ථිකයට ගැලපෙන්නේ නැත. එහෙත් අර්බුදය විසින් ආණ්ඩුවත් ධනපති ක්‍රමයත් එතැනට තල්ලු කොට තිබේ.

ඒ අතර ණයවර ලිපි විවෘත කිරීමෙන් තොරව විශ්වාසය මත ගෙන්වාගත් අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ ඇතුළත් බහාලුම් 800ක් පමණ නිදහස් කර ගැනීමට නොහැකිව කොළඹ වරායේ සිරවී තිබේ. ඒ, එකී භාණ්ඩ එවූ විදේශීය සමාගම්වලට එම භාණ්ඩ වෙනුවෙන් මුදල් (ඩොලර්) යැවීමට නොහැකිවී තිබීමෙනි. ලංකාව මුහුණදී සිටින විදේශ විනිමය අර්බුදයේ තරම එයින් පෙනේ.

විදේශ විනිමය හිඟයට පිළියමක් ලෙස ආණ්ඩුව සමහර භාණ්ඩ ගෙන්වීම සීමා කරමින් හෝ නතර කරමින් ආනයන සීමා පැනවීමත්, අත්‍යවශ්‍ය භාණ්ඩ ඇතුළු භාණ්ඩ වර්ග 623ක් සඳහා එකී භාණ්ඩ ගෙන්වීමේදී භාණ්ඩවල මුළු වටිනාකම ණයවර ලිපි නිකුත් කරන මොහොතේම බැඳිය යුතු යැයි නීති දැමීමත්, සමහර භාණ්ඩ වරායේ හිරවීමත්, සමහර භාණ්ඩවල මිල වැඩිකිරීමට සමාගම් විසින් උත්සාහ කිරීමත් ආදී කරුණු කිහිපයක් නිසා ලංකාව තුළ භාණ්ඩ මිල ඉහළ යාමට අමතරව භාණ්ඩ හිඟයක්ද ඇතිවී තිබේ.

කොරෝනා ඇඳිරිනීතිය (මෙය නාමික එකකි) යටතේ පවා ජනතාව ගෑස් ගැනීමට පෝලිම්වල වරු ගණන් සිටිනු පසුගිය දිනවල දැකගත හැකි විය. එලෙසින්ම කිරිපිටි පෝලිම්ද ඇතිවිය. ලංකාව යළි පෝලිම් යුගයක් කරා ගමන් කිරීමේ පෙරමඟ ලකුණු මෙසේ පෙන්වා ඇත. අර්බුදයේ බරපතළකම ඉන් වටහාගත හැක.

මූල්‍ය අර්බුදය මෙසේ වර්ධනය වෙද්දී එය සමනය කරන දිශාවට නොව එය උග්‍රකරන දිශාවට කටයුතු කරන ආණ්ඩුව, තව තවත් ණය උගුලේම රට හිරකරමින් ජාවාරම්කරුවන්ට ලාභ පොදි ගසාගැනීමට ඉඩ දෙමින් අර්බුදයේ වගකීමෙන් තමන් මිදීමටද උත්සාහ ගනිමින් සිටී.

රට මුහුණදී තිබෙන මූල්‍ය අර්බුදය විසඳීමට නොහැකි හා ඒ වෙනුවෙන් ගත යුතු නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු නොකරන ආණ්ඩුව ඒ වෙනුවට අතීතයට යාමටද යෝජනා කරනු පෙනේ. ආණ්ඩුවේ සමහර ඇමතිවරු පසුගිය දිනවල ජනමාධ්‍යවලට කළ ප්‍රකාශ මගින් පවසා තිබුණේ මේ තත්වය තුළ ලංකාව යළි 1970-77 සිරිමා බණ්ඩාරනායක පාලන කාලයට යා යුතු බවයි.

ධනවාදය තුළ රාජ්‍ය ඒකාධිකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කළ 70-77 සමගි පෙරමුණු පාලනය මුහුණ දුන් මූල්‍ය අර්බුදය නිසා විශාල ආනයන සීමා පනවා තිබුණි. එය සාධාරණය කිරීමට දේශීය නිෂ්පාදන සඳහා යොමු විය. එහෙත් ඒ කිසිවක් සාර්ථක වූයේ නැත. හාල් පොලු, මිරිස් පොලු වැටිණි. භාණ්ඩ ප්‍රවාහනය පවා සීමා කළ විශාල භාණ්ඩ හිඟයක් හා පෝලිම් යුගයක් වූ එම යුගය ජනතාවට එපා වීමේ ප්‍රතිඵලය වූයේ 77 එ.ජා.ප.ය හයෙන් පහක බලයක් සහිතව බලයට ඒමය. ඒ නිසා එකල පැවති රාජ්‍ය ඒකාධිකාරී ධනවාදය ආර්ථික උපායමාර්ගයක් ලෙසට අසාර්ථක වූවකි. එය වැරදි ආර්ථික ප්‍රතිපත්තියක් බවත් සංවෘත ආර්ථිකයක් රටකට නොගැලපෙන බවත් පවසමින් විවෘත ආර්ථිකය භක්තියෙන් වැළඳ ගත්තේද මෙම ධනපති පක්ෂ හා එහි නායකයන්මය. දැන් ඔවුන්ම යළි ආපසු යාමට, අතීතයේ අත්හැර දමා ආ ආර්ථික ප්‍රතිපත්තිය වෙත යාමට යෝජනා කිරීම හාස්‍යයකි. එය එක් අතකින් ඉතිහාසයේ සරදමක්ද වේ.

විවෘත ආර්ථිකය තුළ, ආර්ථික කොල්ලය, ණය උගුලක සිරවීම, වංචා දූෂණ ආදිය නිසා නිර්මාණය වී ඇති මෙම මහා ආර්ථික අවපාත ගංවතුරේ ගසාගෙන යන විට එල්ලීමට පිදුරු ගහක්වත් සොයන අයට රාජ්‍ය ඒකාධිකාරී ධනවාදය පිදුරු ගසක් ලෙස හෝ පෙනුණත් එය යථාර්ථයක් නම් නොවේ. වත්මන් නිදහස් වෙළඳපොළ ආර්ථිකය යනු රාජ්‍ය ඒකාධිකාරී ධනවාදය අසමත් වූ විට ඊට විකල්ප ලෙස ධනවාදය විසින්ම හඳුන්වා දුන් ආර්ථික උපායමාර්ගය වේ. ඒ නිසා වත්මන් අර්බුදයට විසඳුම යළි ධනවාදය තුළම සංවෘතභාවයට යාම නොවේ.

වත්මන් ආර්ථික අවපාතයට, මූල්‍ය අර්බුදයට, විනිමය හිඟයට ඇත්තේ එකම විසඳුමකි. ඒ සමාජවාදී මූලධර්ම මත ගොඩනැගෙන නිෂ්පාදන ආර්ථික මොඩලයකි. දිගුකාලීන මධ්‍යකාලීන හා කෙටිකාලීන සැලැස්මක් තුළ සමස්ත ජනතාව සම්බන්ධ කරගත් රටේ ස්වාභාවික සම්පත් හඳුනාගෙන ඒවා නිෂ්පාදන මාර්ග බවට හරවා ගත් නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනගන්නේ නැතිව, වංචා, දූෂණ මූල්‍ය නාස්තිය අවම කරගන්නේ නැතිව, ආර්ථිකයේ ප්‍රතිලාභ පවුල් කිහිපයක් අතට, ජාවාරම්කාර පැලැන්තියක් අතට පත්වීම නවතා ආර්ථිකයේ සාධාරණත්වය හැදීමෙන් තොරව මෙම අර්බුදය විසඳිය නොහැක.

එහෙත් එය කළ හැකි වන්නේ, ගැඹුරු හා පුළුල් දේශපාලන පරිවර්තනයක් තුළ පමණක් බව අවධාරණය කළ යුතුය. ලංකාවේ දේශපාලනය ධනවාදය තුළ වැටී ඇති මේ නරුමකමින් මුදා ගන්නේ නැතිව, දේශපාලනය පාදඩකරණයෙන් මුදාගන්නේ නැතිව, එය ජාවාරමක් වෙනුවට මහජන සේවයක් බවට පත්කරන්නේ නැතිව, පාලනය කරන අය දෙන ආදර්ශයන් මගින් ජනතාව තුළ ආකල්පමය පරිවර්තනයක් කරන්නේ නැතිව මෙවැනි මහා අර්බුදයකට විසඳුම් සෙවිය නොහැක.

එබැවින් පවතින අර්බුදය ඉල්ලා සිටින්නේ, අතීතයට යාමට නොව වඩා හොඳ අනාගතයක් දෙසට යාම බව ජනතාව අවබෝධ කරගත යුතුය. ඒ සඳහා පවතින ධනවාදී ආර්ථික හා දේශපාලන මූලයන් වෙනස් කරන පුළුල් සමාජ ආර්ථික දේශපාලන පරිවර්තනයක් අවශ්‍ය බවද අවබෝධ කරගත යුතුය.

# ගැසට් රිවස්-රටත් රිවස්

වෙළඳපොළේ සහල් මිල සඳහා මිල පාලනයක් පනවමින් වෙළඳ ඇමති බන්දුල ගුණවර්ධන විසින් නිකුත් කර තිබූ නියෝගය පසුගියදා ඔහු විසින්ම හකුළා ගනු ලැබීය. ඒ අනුව මේ ආණ්ඩුව බලයට පත්වූ පසු රිවස් කරන ලද ගැසට් පෝලිමේ නවතම එක වන්නේ එයය.

මීට සති කිහිපයකට පෙර සහල් මිල පාලන නීති පනවා, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස්වරයෙක්ද පත්කර රූපවාහිනී කැමරාද සහිතව ගොස් හාල්මෝල් වැටලීමේ ත්‍රාසජනක ජවනිකා දෙස මෙරට ජනතාව බලා සිටියේ ක්‍රියාදාම චිත්‍රපටයක් නරඹන්නා සේය. එයට අනුව සහල් මෝල් හිමියන් සතු වී තොග හා හාල් තොග පවරාගෙන ආණ්ඩුව විසින් අඩු මිලට සහල් ලබාදිය යුතුව තිබුණි. එහෙත් දැන් සිදුව ඇත්තේ ඊට හාත්පසින්ම වෙනස් දෙයකි. අඩු මිලට වී මිලදී ගෙන ගබඩා කරගෙන සිටි මහා මෝල් හිමියන්ට දැන් හිතුමනාපෙට සහල් මිල තීරණය කර වෙළඳපොළට දැමීමේ ඉඩ මින් විවෘතව තිබේ. අවසානයේ ආණ්ඩුවේ 'කරුමය' යළිත් කඩා වැටෙන්නේ ජනතාවගේ හිස මතටය.




සහල් සඳහා තිබූ මිල පාලනය ඉවත්කරන අතරම වෙළඳ ඇමති පවසා තිබුණේ වෙළඳපොළේ සහල් හිඟයක් ඇති කිරීම වැළැක්වීමට විදේශයෙන් සහල් මෙට්‍රික් ටොන් ලක්ෂයක් ඇනවුම් කරන බවය. එවිට අපට සිහිවන්නේ මහදැනමුත්තාවය. සහල් මෙට්‍රික් ටොන් ලක්ෂයක් ඇනවුම් කරන බව පැවසුවද එය රටට ගෙනන තුරු විශ්වාස නැත. ඒ, ආණ්ඩුව දැවැන්ත විදෙස් මුදල් හිඟයකට මුහුණපා සිටින නිසාය. වරායට ගොඩබා තිබූ අත්‍යවශ්‍ය ආහාර හා කිරිපිටි ඇතුළු බහාලුම් 800ක් පමණ ඩොලර් නැතිකමින් වරායෙන් නිදහස් කර ගැනීමට නොහැකිව සති ගණනක් වරායේ තිබෙන්නට ඉඩහළ ආණ්ඩුවක් සහල් ආනයනය කිරීමට තීරණය කරන විට සිනහ නොවී සිටිය නොහැක.

අනෙක් අතට මේ තීරණය නිවැරදිද නැත. විදෙස් මුදල් හිඟයක් පවතින ඒ නිසා විදේශවලින් ආනයනය කළ යුතු අත්‍යවශ්‍ය භාණ්ඩ පවා ආනයනය සීමා දමා තිබෙන වෙලාවක සහල් ආනයනය කිරීම මෝඩකමකි. කළ යුතු වන්නේ වෙළඳපොළේ හිඟයක් ඇති නොවන ලෙස වී වගාකිරීමට ගොවීන්ට උදව් කිරීමය. එහෙත් මේ ආණ්ඩුව සතුව ඇත්තේම "පය බරවායට පිටිකර බෙහෙත් බඳින" වර්ගයේ විසඳුම්ය.

පසුගිය කාලය පුරාම මිල පාලනය සඳහා, ආනයනය අපනයනය සඳහා, සමහර සේවාවන් සඳහා ජනාධිපති ඇතුළු ආණ්ඩුවේ ඇමතිවරුන් විසින් නිකුත් කරන ලද ගැසට් රැසක් රිවස් කළ අයුරු අපි දුටුවෙමු. එය එලෙස වන්නේ ඇයි? ජනතාවට වැදගත් වන්නේ එම ප්‍රශ්නයයි.

වත්මන් ආණ්ඩුව යනු රටේ සැබෑ ප්‍රශ්න පිළිබඳ කිසිදු අවබෝධයක් නැති, පැහැදිලි දැක්මක් හෝ ප්‍රතිපත්තියක් නැති, කළ යුතු දේ නොකළ යුතු දේ ගැන වැටහීමක් නැති, අඳුරේ අතපත ගාන, හිතෙන හිතෙන දේ කරන එකක් බවට පත්ව තිබේ. සැබැවින්ම වර්තමාන ආණ්ඩුව රට පාලනය කිරීම හැර අන් හැම දේම කිරීමට උත්සාහ කරයි. ජනාධිපතිවරයා තමන්ට හිතෙන හිතෙන දේ කිරීමට තීරණය ගන්නා අතර ඇමතිවරුද එයම කරති. එහෙත් විවිධ පුරසාරම් දොඩා, මාධ්‍ය සංදර්ශන පෙන්වා මහා බරපතළ තීරණ ලෙස තමන් විසින්ම ගනු ලැබූ තීරණ ක්‍රියාවට නැගීමට නොහැකි වූ විට නිහඬවම ඒවා අවලංගු කරති. මේ ආණ්ඩුවට 'ගැසට් රිවස්' යන නාමය පටබැඳී ඇත්තේද ඒ නිසාය. මෙයින් සිදුව තිබෙන්නේ කුමක්ද? ආණ්ඩුවේ ගැසට් රිවස් වන වේගයට වඩා වැඩි වේගයකින් 'රට රිවස්' වීමය. එනම් රට ආපස්සට ගමන් කිරීමය. 'රාජ්‍ය පාලනය' නොදන්න මජර කොල්ල කල්ලියකට බලය ලැබුණ විට මීට වඩා වෙනස් දෙයක් බලාපොරොත්තු වීමටද නොහැක.

ආණ්ඩුවේ දැක්මක් නැතිකම අසමත්කම පෙන්වන සාධක රැසක් තිබේ. ජනාධිපතිවරයාගේ "මනෝරාජික ලස්සන සංකල්ප" හා රටේ සිදුවන යථාර්ථය අතර මහා පරස්පරයක් තිබේ. අඩු ගණනේ ජනාධිපතිවරයා හා ගෝලයන්ට එයවත් වැටහෙන බවක් නොපෙනේ.

මේ සඳහා වන හොඳම උදාහරණය රසායනික පොහොර හා කෘෂි රසායන නැවැත්වීමට හදිසියේ ගත් තීන්දුවය. 'වස විසවලින් තොර ආහාර' යනු ඉතාම ලස්සන සුන්දර චිත්තාකර්ෂණීය සංකල්පයකි. එහෙත් එය ක්‍රියාවට නැගීම සඳහා ගත යුතු සැලසුම් හා අත්‍යවශ්‍ය පූර්ව ක්‍රියාමාර්ග නොමැතිව හිටි හැටියේම රසායනික පොහොර නතර කිරීම නිසා දැන් මුළු කෘෂිකර්මාන්තයම අවුල් ජාලයක් වී තිබේ. එක් අතකින් ගොවියන්ට පොහොර නැත. වතු වගාවන්ට පොහොර නැත. එවිට අස්වනු හා කෘෂි නිෂ්පාදන කඩා වැටේ. රටේ විකල්ප පොහොර (කාබනික පොහොර) නිපදවීමට සැලැස්මක් නැත. ඒ සඳහා ප්‍රමිතියක් නැත. ඒ නිසා විවිධ රොඩුබොඩු 'කාබනික පොහොර' ලේබල් යටතේ ගොවියාට විකිණේ. පිටරටවලින් කාබනික පොහොර ලෙස විස සහිත කසල ආනයනය කෙරේ. කාබනික පොහොර ජාවාරමක් බවට පත්ව තිබේ. අවසානයේ කෘෂිකර්මාන්තයත් ගොවියාත් විනාශය කරා තල්ලු කරනු ලැබ තිබේ. රට රිවස් එකට යන්නේ ඒ අනුවය.

එසේම විදුලි බලය පිළිබඳ ප්‍රශ්නයද එසේය. ජනාධිපතිවරයාගේ විදුලිබල සංකල්පය වූයේ පුනර්ජනනීය බලශක්තිය වෙත ගමන් කිරීමය. එය ඉතාම අලංකාර සංකල්පයකි. පසුගියදා එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇමතීමට ගිය ජනාධිපතිවරයා එම කථාවේදීද වසර 2030 වනවිට ලංකාවේ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය 70%ක් දක්වා වැඩි කරන බව ප්‍රකාශ කොට තිබුණි. එලෙස තාප බලාගාර, ඩීසල් බලාගාර හා ගල් අඟුරු බලාගාරවලින් විදුලිය නිපදවීම අඩු කිරීමට පුරසාරම් දොඩන ආණ්ඩුව රට තුළ කටයුතු කරමින් සිටින්නේ ඊට මුළුමනින්ම පරස්පර ලෙසය. එයට හොඳම උදාහරණය කෙරවලපිටිය යුගදනවි බලාගාරයේ කොටස්වලින් 40%ක් ඇමරිකානු පෝට්‍රස් එනර්ජි සමාගමට විකුණා ඉන් නතර නොවී එල්.එන්.ජී. (ස්වාභාවික ගෑස්) බලාගාර සඳහා ලංකාවට ගෑස් සැපයීමේ ඒකාධිකාරී අයිතියද එම සමාගමටම ලබාදීමය. ඒ අනුව ලංකාව සඳහා ගෑස් ගබඩා කිරීම් පර්යන්තය හා ගෑස් බෙදාහැරීමේ නල පද්ධතියක් ඉදිකිරීමේ අයිතියද ටෙන්ඩර් පටිපාටියෙන් තොරවම, හොර රහසේම, එම සමාගමටම ලබා දී තිබේ. එම ගිවිසුමට අනුව ආරම්භයක් ලෙස ලංකාව වසර 05ක කාලයක් සඳහා එකඟවූ මිලකට (වැඩි මිලකට) නිශ්චිත ගෑස් ප්‍රමාණයක් එකී සමාගමෙන් මිලදී ගත යුතුය. එහිදී ආණ්ඩුව, රටට එම ගෑස් අවශ්‍ය වුවත් නැතත් 'මිලදී ගත යුතු හෝ නැතිනම් මුදල් ගෙවිය යුතු' (take or pay) ආකාරයේ ගිවිසුමකට එකඟ වී ඇත. එවිට සිදුවන්නේ ගිවිසුම පවතින තෙක් අවශ්‍ය වුවත් නැතත් ගෑස් මිලදී ගැනීමටය. එය රටට විශාල පාඩුවකි. ඒ නිසාම ගෑස් බලාගාර දිගටම පවත්වාගෙන යාමටද සිදුවේ. එවිට පුනර්ජනනීය බලශක්තිය හුදු පම්පෝරියක් පමණක් වේ. අවසානයේ රටට මහා බරක් පැටවී රටේ සම්පත්ද අපට අහිමි වේ.

මේ සියල්ලෙන් පෙන්වන්නේ දැක්මක්, සැලැස්මක්, වගකීමක් නැති වත්මන් ආණ්ඩුව රට පාලනය කරන්නේ ළමුන් 'සෙල්ලම් ගෙවල්' හදන ආකාරයෙන් බවය. ආර්ථිකයේ විනාශයත්, විදෙස් මුදල් හිඟවීමත් ණය උගුලත්, ආණ්ඩුවේ දැක්මත් මුග්ධ තීරණත් විසින් රට රැගෙන යමින් තිබෙන්නේ ආපස්සට බව, ආගාධයක් වෙත බව පැහැදිලිය. ඒ නිසා ගැසට් රිවස් ආකාරයෙන්ම රටත් රිවස් කරන වර්තමාන පාලනයත්, මේ වැරදි සමාජ ආර්ථික දේශපාලන රටාවත් වෙනස් කළ යුතුව ඇත. මේ මොහොතේ මෙරට පුරවැසියන්ගේ වගකීම වන්නේ එයයි.

> "විදෙස් මුදල් හිඟයක් පවතින ඒ නිසා විදේශවලින් ආනයනය කළ යුතු අත්‍යවශ්‍ය භාණ්ඩ පවා ආනයනය සීමා දමා තිබෙන වෙලාවක සහල් ආනයනය කිරීම මෝඩකමකි. කළ යුතු වන්නේ වෙළඳපොළේ හිඟයක් ඇති නොවන ලෙස වී වගාකිරීමට ගොවීන්ට උදව් කිරීමය. එහෙත් මේ ආණ්ඩුව සතුව ඇත්තේම "පය බරවායට පිටිකර බෙහෙත් බඳින" වර්ගයේ විසඳුම්ය."

# විසඳුම ඇත්තේ ජනතා ක්‍රියාකාරීත්වය ගොඩනැගීම තුළ පමණයි



ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති
ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික
කේ.ඞී. ලාල්කාන්ත සහෝදරයා

***නියමුවා:-*** *ආණ්ඩුවක් ඉතිහාසයේ මේ දක්වා අත නොතැබූ ජාතික සම්පත් විදේශයන්ට විකුණා දැමීම සඳහා වත්මන් පාලනය විසින් උත්සාහ දරමින් සිටිනවා. ඒ අතර මෙරට ආර්ථිකයේ තීරණාත්මක ක්ෂේත්‍ර තුනක් ඒකාබද්ධ කරමින් 'ජාතික සම්පත් විකිණීමට එරෙහි තෙල්, වරාය, විදුලි ඒකාබද්ධ සන්ධානය' පසුගියදා නිර්මාණය වුණා. මේ පෙළගැස්ම පිළිබඳ ඔබේ කියවීම කවරාකාරද?*

***ලාල්කාන්ත සහෝදරයා:-*** ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, අගමැති මහින්ද රාජපක්ෂ, මුදල් ඇමති බැසිල් රාජපක්ෂ මූලික කරගත් වත්මන් ආණ්ඩුව ධනේශ්වර, අධිකාරීවාදී, නව ලිබරල්වාදී පාලනයක්. ලංකාවේ නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මකවීම ආරම්භ වන්නේ 1978 ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනගේ පාලනයේ ආරම්භයත් සමගයි. එතැන් සිට අවුරුදු 43කින් පසුවත් ක්‍රියාත්මක වන්නේ එම ප්‍රතිපත්තියමයි. එම ප්‍රතිපත්තියේ මූලික කටයුත්ත වන්නේ රජය ආර්ථික කටයුතුවලින් ඉවත්වීමයි; අවම මැදිහත්වීමක් සිදුකිරීමයි. තවත් විදියකින් කිව්වොත් සම්භාව්‍ය ලිබරල්වාදයේ මූලධර්ම වර්තමානයට ගලප්පමින් ක්‍රියාත්මක කිරීමයි. මෙම ක්‍රියාවලියේදී වංචා, දූෂණ, කොමිස් ඥාති සංග්‍රහ, මිතුරු සංග්‍රහ හොඳ පදමට සිදු කරගැනීමද අපේ රටේ සිදුවන දෙයක්. රජය ආර්ථික කටයුතුවලින් ඉවත් වන විට එම කටයුතුවලට දේශීය විදේශීය ආයතන ඇතුලත් කරගනු ලබනවා. ඒ වගේම මෙම නව ලිබරල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරද්දී ඒ සඳහා වන කටයුතුවලට ලෝක බැංකුවෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් සහ තවත් බැංකුවලින් ණය ගනු ලබනවා. දූෂිත පාලකයින් ඒවා දූෂණයට, වංචාවට ලක්කර කොල්ලකෑවා. ගත්ත ණය සහ ඒවායේ පොලියත් ගෙවාගැනීමට බැරි හිඟන රටක් දැන් අප හමුවේ තියෙනවා. දැන් හොරකම් කරපු මුදල් නීත්‍යානුකූල කර රටේ ජාතික සම්පත් තමන්ගේ අතට පුද්ගලිකව ලබාගන්න පුළුවන් වෙන්න නීති හදාගත්තා. අධිකාරීවාදී දේශපාලන බලය යොදාගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ඇමතිවරු රූකඩ කරගෙන බලහත්කාරීව රජය සතු ඉඩම් ආයතන, ගොඩනැගිලි විකුණන වැඩපිළිවෙලට කොළඹ වරායත්, ඛනිජ තෙල්, විදුලි, බලශක්ති ක්ෂේත්‍රයත් ඇතුල් කරගෙන ක්‍රියාත්මක කරමින් තිබෙනවා.

ජාතික සම්පත් විකිණීමට අමතරව ජාතික ආරක්ෂාවටත් බරපතළ තර්ජනයක් මේ තුළින් ඇතිවෙනවා. තවත් පැත්තකින් ඇමෙරිකාව සහ ඉන්දියාව චීනය සමගත්, චීනය එම රටවල් සමගත් දේශපාලන බල අරගලයක ඉන්නවා. මේ පාලකයෝ දැන් එම බල අරගලය බුලත් දී පිළිඅරන් අපේ රට තුළට කැන්දගෙන තිබෙනවා. ඔවුන්ගේ ගැටුමේ මේ බෝම්බ අපේ රට ඇතුලේ කුමන හෝ වෙලාවක පත්තුවෙනවාමයි. මේ මොහොතේදී ඔවුන් අතර සීතල යුද්ධයක් අප රට තුළ ක්‍රියාත්මකයි. මේක බරපතළ තත්වයක් නිසා අපට සිද්ධවුණා තෙල්, විදුලි, වරාය එකතු කර 'ජාතික සම්පත් විකිණීමට එරෙහි තෙල්, විදුලි, වරාය ඒකාබද්ධ සන්ධානය' ගොඩනගන්න. ආණ්ඩුවට සම්බන්ධ වෘත්තීය සමිති හැර අනෙක් සියල්ලම වගේ මේ සන්ධානයට එකතුවෙලා තියෙනවා. සම්බන්ධ නොවූ අය සම්බන්ධ කරගැනීමට උත්සාහ කරමිනුත් ඉන්නවා. නමුත් මේ සටනේ කේන්ද්‍රය වෘත්තීය සමිති වුණත් සටන දිනන්න නම් රට ගැන ආදරයක් තියන අනෙක් සියලු දෙනා මේ සටන වටා එකතු කරගැනීම අත්‍යවශ්‍යයි. මහානායක හිමිවරුන් සමග, මේ ආණ්ඩුව ගොඩනගන්න විශාල කාර්යභාරයක් කළ හාමුදුරුවරුන් සමග වගේම පූජකතුමන්ලා සමග දැනුවත් කිරීමේ සහ සහයෝගය ලබා ගැනීමේ සාකච්ඡා ආරම්භ කර තිබෙනවා. ආණ්ඩුවට පිටින් තිබෙන දේශපාලන පක්ෂ සමගද ආණ්ඩුව ඇතුලේ ඉන්න දේශපාලන පක්ෂ සමගද සාකච්ඡා පටන් ගත්තා. මේ ඔක්කොම කරන ගමන් අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික වෘත්තීය සමිති, සන්ධානය වටා එකතු කරගැනීම ආරම්භ කළා. සටන ජයග්‍රහණයෙන් කෙළවර කරන්න අපි හැමෝම එකතුවෙමු.

***නියමුවා:-*** *මෑත කාලයේ වෘත්තීය සමිති ක්ෂේත්‍රයේ දැවැන්තම අරගලයක් අප දුටුවේ ගුරු-විදුහල්පති වැටුප් විෂමතා සටන තුළයි. ආණ්ඩුවේ ඍජු මර්දනකාරීත්වය මෙන්ම සටනට අවලාද අපහාස එල්ල කිරීමත් ඊට එරෙහිව අරගලයේ එකමුතුවත් අරගල සාහිත්‍යයක් බිහිවීමත් දැකගන්නට ලැබුණා. තවමත් අවසන් නොවී ඇති මේ සටන ඔබ දකින්නේ කොහොමද?*

***ලාල්කාන්ත සහෝදරයා:-*** අවුරුදු 24ක් පුරා ගුරුවරුන්ට, විදුහල්පතිවරුන්ට, පිරිවෙන් ගුරුවරුන්ට වැටුපෙන් භාගයයි ගෙවන්නෙ. කිසිවෙක් පඩි භාගයක් අරන් වැඩ කරන අය නැහැ. මුළු රටම මේ වෘත්තිකයින්ට ණයයි. ණය ඉල්ලන්නේ නැතුව දැන්වත් සම්පූර්ණ වැටුප ඉල්ලා මේ කරන අරගලය සාධාරණයි කියල කවුරුත් පිළිගන්න. ආණ්ඩුව යුක්තිය සාධාරණය ඉටු නොකර කල් ඇරීම නිසා, විදුහල්පතිවරු, ගුරුවරු මෙන්ම දරුවන් සහ දෙමව්පියන්ද දරුණු පීඩාවකට පත්කර තිබෙනවා. සටනේ ඉන්න අය සූදානම් නැහැ සටන අත්හරින්න. දුර්වලයින් පාවාදීම් කරනවා කවදත්. එහෙම කිහිප දෙනෙකුත් වාර්තා වෙනවා. සටන අත්හරින සුළු පිරිසකුත් ඉන්නවා.

ආණ්ඩුවේ සහ පරිපාලනයේ බලපෑම් නිසා මේ සටන අනාගතයට ඉතිරි කළහොත් නැවතත් ඕනම වෙලාවක සටන එනවාමයි. එහෙම තත්වයකට පත්වෙලා නැවතත් මෙවැනි පීඩාකාරී තත්වයකට සමාජය පත්වෙනවාට වඩා හැමෝම අධිෂ්ඨානයෙන් මැදිහත්වෙලා මේක ඉවරයක් කරගන්න ඕනෑ. ආණ්ඩුවේ මර්දනය එන්නෙ, මඩ අවලාද එන්නෙ සටනක් සාර්ථක වෙනකොට. ඒක හැමෝම දැනගන්න ඕන. ගුරු විදුහල්පති, පිරිවෙන් ගුරු වෘත්තීය සමිති සන්ධානයට අපි කියන්නෙ දැන් අලුත් වටයකින් සටන අලුත් කරන්න කියලා. ගත්ත ක්‍රියාමාර්ග දැන් ටිකක් එකතැන පල්වෙනවා. දෙමව්පියන් දරුවන් මෙන්ම ගුරු විදුහල්පති හැමෝම දැන් සටනේ ඉදිරි පියවරක් බලාපොරොත්තු වෙනවා. ලංකා ගුරු සේවා සංගමයට අපි දැනුම්දී තියෙනවා සන්ධානයේ එකඟතාවයක් මගින් සටනේ ඉදිරි පියවරක් තියන්න කියල. අපේ යෝජනාව වන්නේ ප්‍රශ්නය විසඳන්න ආණ්ඩුවට මාස 03ක් කල් දී නැවත සියලු අධ්‍යාපන කටයුතු පටන් ගන්න ඕන කියන එක. එම මාස 03 ඇතුලත දෙමව්පියන් සහ දරුවන් ශක්තිමත්ව සංවිධානය කරන්න ඕනෑ. මාස 03 ඇතුලත විසඳුවේ නැත්නම් සියලු දෙනාම එකට එකතුවෙලා සියලු වෘත්තීය සමිති ඒකාබද්ධ කරගෙන ආණ්ඩුවට හොඳ පාඩමක් උගන්වන්න ඕනෑ. ඒක තමයි ශක්තිමත් ඉදිරි පියවර වෙන්නෙ. නමුත් අවසන් තීරණය ගැනීම වෘත්තීය සමිති සන්ධානය සතුයි. මේක අපේ යෝජනාව. මෙම අරගලය තුළ නව අරගල හැඩයන් සැලකිය යුතු ප්‍රමාණයක් නිර්මාණය වෙලා තියෙනවා. විශේෂයෙන් රත්න ශ්‍රී වගේ ගීත රචකයන් ගීත ලියා තිබෙනවා. තව බොහෝ දෙනෙක් සටන ශක්තිමත් කිරීම සඳහා කලාත්මක, ඒ වගේම අධිෂ්ඨානශීලී කවි, ගීත නිර්මාණය කර තිබෙනවා. මේක ඉතාම සාධනීය තත්වයක්. ඒවගේම විශ්වවිද්‍යාල මහාචාර්යවරු, ආචාර්යවරු සහ තවත් ප්‍රගතිශීලී බොහෝ දෙනා මෙම සටන ශක්තිමත් කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ ගුරුවරුන් සමග වැඩසටහන් ක්‍රියාත්මක කරමින් තිබෙනවා. ඒක ඉතාමත් සාධනීය තත්වයක්.

***නියමුවා:-*** *සියලු ක්ෂේත්‍රයන්හි අසමත් බවට චෝදනා එල්ල වන අතරතුර ආණ්ඩුව නැවතත් හදිසි නීතිය බලාත්මක කිරීමටත් ක්ෂේත්‍ර ගණනාවක් අත්‍යාවශ්‍ය සේවා බවට ප්‍රකාශය පත් කිරීමටත් කටයුතු කළා. මෙයින් ආණ්ඩුව අදහස් කරන්නේ මොකක්ද?*

***ලාල්කාන්ත සහෝදරයා:-*** ඕවා සාමාන්‍ය දේවල්. වැඩිය ගණන් ගන්න ඕන නැහැ. හැබැයි තහවුරු වෙන්න දෙන්න හොඳ නැහැ. දල්ලෙන්ම කඩා දාන්න ඕනෑ. නිරෝධායන මර්දනය ජනතාව කැඩුවනෙ. අත්අඩංගුවට අරන් බියවද්දන්න හැදුවා. බැරිවුනානෙ. CID එකෙන් එනව පස්සෙ. කවුද ඒව ගණන් ගන්නෙ. කිසි කෙනෙක් ගණන් ගත්තෙ නැහැ. හදිසි නීතිය දැම්මත්, අත්‍යවශ්‍ය සේවා පැනෙව්වත් වැඩකරන පංතිය සංවිධානාත්මකව මැදිහත්වෙනවානම් තමන්ගෙ ශක්තිය මගින් ඉල්ලීම් දිනාගන්න පුළුවන්. ජනතාව දැන් ඉන්නෙ නිදහස සහ අයිතිවාසිකම් දිනාගැනීමේ අරගලයක. සමාජ විමුක්තිය වෙනුවෙන් කරන අරගලයක. අත්අඩංගුවට ගනිල්ලා, හිරේ දාපල්ලා. අපි ලෑස්තියි කියන තැනට ජනතාව ආවට පස්සෙ ඔය මර්දන අණපනත් අත්හැරල පාලකයින්ට අන්තිමට සිද්ධ වෙන්නෙ තමන්ගෙ මව් රට වුණු ඇමෙරිකාවට පසු බහින එක. ඒ පිළිබඳව අපිට අතීත අත්දැකීම් තියෙනවා. 1953 ආර්ථික පීඩාවන් හමුවේ ජනතාව පාරට බැස්සම එවකට බලයේ හිටපු නායකයො රට දාල පැනල ගියා. මුහුද මැද්දෙ නැවක තමයි රැස්වුණේ. හැබැයි අරගලයට නායකත්වය දීපු අය අරගලය නවත්තලා අර පැනල ගියපු අය නැවත ගෙන්නගෙන සිංහාසනේ වාඩි කෙරෙව්වා. හැබැයි මේ පාලකයො සම්බන්ධයෙන් නම් ඉතාම පැහැදිලියි, ජනතාව අරගල කරලා ඔවුන්ව ඔවුන්ගෙ මව්රටටම පලවා හරිනවා ආපසු නොඑන්නම!

> ජනතාව දැන් ඉන්නෙ නිදහස සහ අයිතිවාසිකම් දිනාගැනීමේ අරගලයක. සමාජ විමුක්තිය වෙනුවෙන් කරන අරගලයක. අත්අඩංගුවට ගනිල්ලා, හිරේ දාපල්ලා. අපි ලෑස්තියි කියන තැනට ජනතාව ආවට පස්සෙ ඔය මර්දන අණපනත් අත්හැරල පාලකයින්ට අන්තිමට සිද්ධ වෙන්නෙ තමන්ගෙ මව් රට වුණු ඇමෙරිකාවට පසු බහින එක.

***නියමුවා:-*** *ආර්ථික අර්බුදයෙන් බැටකමින් සිටින වැඩකරන ජනතාවගේ පීඩාව කොවිඩ් වසංගත තත්වය විසින් තීව්‍ර කරනු ලැබ තිබෙනවා. කෙසේ වුවද වසංගත තත්වය විසින්ම ඊට එරෙහිව සාම්ප්‍රදායික අරගල මඟට පිවිසීමට බාධා කරමින් තිබෙනවා. මේ තත්වය ජය ගැනීම සඳහාත් දේශපාලන අරගලය සඳහාත් වැඩකරන ජනතාව කළ යුත්තේ කුමක්ද?*

***ලාල්කාන්ත සහෝදරයා:-*** කොරෝනා අර්බුදය, ආර්ථික අර්බුදය, ආණ්ඩුකරණයේ අර්බුද කියන ත්‍රිත්ව අර්බුදයකට ආණ්ඩුව ගොදුරුවෙලා ඉන්නවා. මේ නිසා දැඩි අධිකාරීවාදී විකල්පයක් දෙසට ආණ්ඩුව ගමන් කරන්න ඉඩක් තිබෙනවා. ප්‍රගතිශීලීන්ට සිදුවෙනවා පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී මහජන ව්‍යාපාරයක් මගින් ආණ්ඩුවට ප්‍රති උත්තරයක් ලබාදෙන්න. අපි දැනට මුහුණ දෙන ගැටලුව වන්නේ මේ ප්‍රගතිශීලී අය විසිරිලා සිටීමයි. කාටත් කළ හැකි පළමු දෙය වන්නේ තම තමන් සිටින තැන්වල සිට ආණ්ඩුවට එරෙහිව අරගල

10 වැනි පිටුවට

# තලේබාන් පාලනයට පසුවදනක්



එක්සත් ජනපදය ඇෆ්ගනිස්ථානයෙන් හදිසියේ හමුදා ඉවත් කර ගැනීම විවේචනය කරන්නන්ට පිළිතුරු දෙමින් එක්සත් ජනපද ජනාධිපති ජෝ බයිඩන් ප්‍රකාශ කළේ, ' ත්‍රස්තවාදය ඇෆ්ගනිස්ථානයෙන් ඔබ්බට පැතිර ගොස් ඇති බවත්, සෝමාලියාවේ අල් සබාහ් සංවිධානය, සිරියාවේ හා අරාබිකරයේ අල් කයිඩා සංවිධානය, සිරියාවේ, ඉරාකයේ, අප්‍රිකාවේ හා ආසියාවේ ISIS සංවිධානය ආදී ත්‍රස්ත සංවිධානයන්ගේ තර්ජනයන්ට මුහුණ දීමට සිදුවී ඇති බවත්ය. ත්‍රස්තවාදයේ තර්ජනය දරුණු ස්වභාවයකින් අනෙක් රටවල් කරාද පැතිර ඇති බැවින් තමන්ටද උපක්‍රම වෙනස් කිරීමට සිදු වී ඇති බවත් ඔහු පැවසීය. මින් අදහස් කරන්නේ එක්සත් ජනපදයේ 'ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය' විසින් ත්‍රස්තවාදය පැටව් ගසා ඇති බවය. එක්සත් ජනපදය ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කරද්දී එක් ඉලක්කමකින් පෙන්විය හැකිව තිබූ ත්‍රස්තවාදී සංවිධාන ගණන ඇෆ්ගනිස්ථානය තුළ 'ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය' අවසන් කරද්දී 20කට වඩා ඉහළ ගොස් තිබේ.

## ඒ.ජ. ත්‍යාගශීලීත්වය

මීට අවුරුදු 20 කට පෙර ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කරද්දී එවකට එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් බුෂ් කීවේ අල් කයිඩා ත්‍රස්තවාදීන්ට රැකවරණය ලබා දීම වෙනුවෙන් තලේබාන්වරුන් වන්දි ගෙවිය යුතු බවය. එසේම ඔහු තවදුරටත් පැවසුවේ තලේබාන් පාලනය යටතේ පීඩාවට පත් වී සිටින ඇෆ්ගන් ජනතාව එක්සත් ජනපදයේ සහ ඔවුන්ගේ සහායකයන්ගේ ත්‍යාග ශීලීත්වය පිළිබඳ හොඳින් දන්නා බවය. එක්සත් ජනපදය හා ඔවුන්ගේ සහචරයන්ගේ ත්‍යාගශීලීත්වය ඇෆ්ගන් ජනතාවට ලබා දී ඇත්තේ මොනවාද? එක්සත් ජනපද ආක්‍රමණයේ විසි වසරක කාලය තුළ පැවති සිවිල් යුද තත්වය හේතුවෙන් ඇෆ්ගන් වැසියන් 47,000කට වැඩි පිරිසක් ජීවිතක්ෂයට පත් වූ අතර මිලියන 06කට වැඩි පිරිසක් අවතැන් වූහ. ඇෆ්ගනිස්ථානයේ ආර්ථිකය විනාශ කර දමනු ලැබ තිබේ. කොවිඩ් 19 වසංගතය විසින් ඇති කර ඇති සමාජ අර්බුදයත්, ආහාර හිඟයත්, සනීපාරක්ෂක හා සෞඛ්‍ය පහසුකම්වල හිඟයත් සමගින් එරට ජනගහනයෙන් භාගයක් පමණ සාගතයකට මුහුණ දී සිටී. මෙම මුළු කාලය තුළ දී එක්සත් ජනපදය ඇෆ්ගනිස්ථානය ගොඩ නැගුවේ නැත; විනාශ කළා පමණකි. ඔවුන් එරට කර්මාන්තය, කෘෂි කර්මාන්තය හෝ යටිතල පහසුකම් හෝ නගා සිටුවීම සඳහා කිසිවක් කළේ නැත.

ඇෆ්ගනිස්ථාන් ආක්‍රමණය එක්සත් ජනපද ජනතාවට ලබා දුන් දෙයක් ද නැත. ඇෆ්ගනිස්ථානු මෙහෙයුමට එක්සත් ජනපද හමුදා සෙබළුන් 775,000ක් සම්බන්ධ වූ අතර ඉන් 20,589 දෙනෙක් අනතුරට ලක් වූහ. 2461 දෙනෙක් මරණයට පත් වූහ. අනතුරට ලක් වූවන්ගෙන් බහුතරය පසු කම්පන තත්වයන්ගෙන් පීඩා විඳින අතර දළ වශයෙන් දිනකට 18 දෙනෙකු පමණ සිය දිවි හානි කර ගනිමින් සිටිති. එක්සත් ජනපද ජනතාවගේ අධ්‍යාපන, සෞඛ්‍ය ඇතුළු අනෙකුත් පහසුකම් වෙනුවෙන් යෙදිය හැකිව තිබූ ඩොලර් ට්‍රිලියන 2.3ක් ඇෆ්ගන් යුද්ධය වෙනුවෙන් වැය කරනු ලැබ තිබේ.

## තලේබාන්වරු වන්දි ගෙවූ හැටි

අල් කයිඩා ත්‍රස්තවාදීන්ට රැකවරණය ලබා දීම වෙනුවෙන් තලේබාන්වරුන් විසින් ගෙවා ඇති වන්දිය කුමක්ද? එක්සත් ජනපද හමුදා ඇෆ්ගනිස්ථානයෙන් ඉවත් ව යාමත් සමග තලේබාන්වරු යළිත් එරට පාලන බලය අත්පත් කර ගත්හ. එක්සත් ජනපදය තලේබාන්වරුන්ට වාහන 75,000ක්, ගුවන් යානා සහ හෙලිකොප්ටර 200ක්, අවි ආයුධ 699,000ක් ඇතුළු ඩොලර් බිලියන 85ක් වටිනා උපකරණ අත් හැර දමා ගොස් තිබේ. (එක්සත් ජනපද කොංග්‍රස් සභික ජිම් බැංකි) ඇෆ්ගන් ජනතාවට හොඳින් සන්නද්ධ කරන ලද ඉස්ලාම් අන්තවාදී සහ ත්‍රස්තවාදී සංවිධානයක පාලනයක් උරුම කර දී තිබේ. තලේබාන්වරු සිය ආණ්ඩුව Islamic Emirate of Afganistan ලෙස නම් කළහ. එහි අදහස වන්නේ ආගමික නායකයෙකුගේ මූලිකත්වයෙන් කෙරෙන පාලනයක්ය යන්නය. ඔවුන් 33දෙනෙකු ගෙන් යුතු ආණ්ඩුවක් නම් කළ අතර ඉන් 03 දෙනෙකු පෂ්තුන්වරුය. දෙදෙනෙකු තජික්වරු වන අතර එක් අයෙක් උස්බෙක්වරයෙකි. මෙම ආණ්ඩුව තුළ හසාරාවරයෙකු හෝ කාන්තාවක් හෝ වෙනත් ජන වර්ගයන්ගේ නියෝජනයක් නොමැත. තලේබාන් ආණ්ඩුවේ අගමැතිවරයා වන මුල්ලා හසාන් අක්හුන්ඩ් තලේබාන්වරුන්ගේ ඉහළම මණ්ඩලයේ ප්‍රධානියාය. 1996-2001 තලේබාන් පාලන සමයේ උප අගමැතිවරයා ලෙසත් විදේශ ඇමතිවරයා ලෙසත් කටයුතු කළ ඔහු අණදෙන නිලධාරියෙකි; තවමත් එක්සත් ජාතීන්ගේ සම්බාධකවලට ලක් වී සිටින්නෙකි. මෙම ආණ්ඩුවේ තවත් සාමාජිකයන් හතර දෙනෙකු ගුවන්තනාමෝ කඳවුරේ සිරගතව සිට 2014 වසරේ එක්සත් ජනපද සෙබළෙකු වෙනුවට හුවමාරු ලෙස නිදහස් වූ අයයි. ඔවුහු පසුගිය වසරේ දෝහාවල පැවති එක්සත් ජනපද තලේබාන් සාකච්ඡා සඳහා සහභාගි වූහ.

මෙම හතර දෙනා අතරින් එක් අයෙකු වූ අබ්දුල් හක් වසික් තලේබාන් පාලනයේ බුද්ධි කටයුතු අධ්‍යක්ෂවරයායි. විකිලීක්ස් හරහා හෙළි කළ තොරතුරු අනුව ඔහු අල් කයිඩා බුද්ධි අංශ සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇති අතර තලේබාන්වරුන්ට බුද්ධි සේවාවන්හි පුහුණුව ලබාදීම සඳහා මැදිහත් වී තිබේ. දේශසීමා සහ ගෝත්‍රික කටයුතු පිළිබඳ වැඩ බලන අමාත්‍යවරයා වන මුල්ලා නූරුල්ලා නූරි නැමැත්තා ෂියා මුස්ලිම්වරු දහස් ගණනක් ඝාතනයට වගකිව යුතු හා එබැවින් යුද අපරාධකරුවෙකු ලෙස නම් කළ යුතු අයෙකි. තලේබාන් පාලනයේ වැඩ බලන අභ්‍යන්තර ඇමතිවරයා වන සිරජුඩින් හබානි නැමැත්තා එක්සත් ජනපදයේ FBI ආයතනයට අවශ්‍යව සිටින සහ ඔහු අල්ලා දෙන කෙනෙකුට ඩොලර් මිලියන 05ක ත්‍යාගයක් ලබා දෙන බවට ප්‍රකාශ කර ඇති අයෙකි.

## ලාභ ලැබූවෝ

එක්සත් ජනපදයේ 'ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයෙන්' ජය ලැබුවේ තලේබාන්වරුන් පමණක් නොවේ. එක්සත් ජනපද යුද ආයුධ නිෂ්පාදන සමාගම්ද ඉන් ජය ලැබීය. Boeing, Lockheed Martin, Northrop Grumman, Raythcon, General Dynamic වැනි සමාගම්ද එම කාලය තුළදී දස ගුණයකට වඩා වැඩි ලාභ ලබා ගත්හ.

මීට අමතරව මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෝද එකී යුද්ධයෙන් ජය ලැබූහ. පෙර පැවති තලේබාන් පාලනය විසින් පොපි මල්වලින් ඕපියම් නිෂ්පාදනය මුළුමනින්ම නවතා දමා තිබුණද 2020 වසරේදී ලෝකයේ විශාලතම ඕපියම් නිෂ්පාදනය වූ ටොන් 6300ක් ඇෆ්ගනිස්ථානය තුළ දී නිෂ්පාදනය කෙරුණි.

තලේබාන්වරුන්ට රැකවරණය, පුහුණුව හා ආධාර ලබා දෙන්නේ පකිස්ථානය විසිනි. පසුගිය නියමුවා කලාපයේදී අප පෙන්වා දුන්නාක් මෙන් ඇෆ්ගනිස්ථානය තුළ ඉස්ලාම් අන්තවාදී පාලනයක් ස්ථාපිත වීම ලෝකයේ අනෙකුත් ඉස්ලාම් අන්තවාදී සංවිධානවලට විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස නම් කර ඇති නැගෙනහිර තුර්කිස්තාන් ඉස්ලාමීය ව්‍යාපාරය වැනි සංවිධානවලට නව පණක් ඒමට බලපානු ඇත. එය කලාපයේ ඉස්ලාම් අන්තවාදයේ තර්ජනයට ලක් වී ඇති රටවලට අහිතකර ලෙස බලපායි. මේ අතර පසුගිය සැප්: 08වැනදා පාකිස්ථානයේ මූලිකත්වයෙන් ඇෆ්ගනිස්ථානය සමග දේශ සීමාව බෙදා ගන්නා රාජ්‍යයන් වන චීනය, ඉරානය, තජිකිස්ථානය, තුර්ක්මේනියාව හා උස්බෙකිස්ථානය මේ තත්වය පිළිබඳ සාකච්ඡා කළහ. සාකච්ඡා අවසානයේ පොදු ප්‍රකාශයක් නිකුත් කරමින් පවසා තිබුණේ ඇෆ්ගන් ජනතාව තමන්ගේ ඉරණම තීරණය කළ යුතු බවත් එය ඇෆ්ගනිස්ථානය මූලික වූ, ජාතික සමගිය හා සංහිඳියාව ඇති කරලන සියලු ජනවර්ග සහභාගි කර ගත් යුදමය නොවන තමන්ගේම විසඳුමක් විය යුතු බවය.

## ඔස්ට්‍රියාව: ග්‍රාස් නුවර රතු ධජ එසවෙයි




ඔස්ට්‍රියාවේ ස්ටයිරියා ප්‍රාන්තයේ අගනුවර වන ග්‍රාස් නගරයේ නගර සභාව තෝරා පත් කර ගැනීම සඳහා සැප්තැම්බර් 26වැනිදා පැවැත්වූ මැතිවරණයෙන් එරට කොමියුනිස්ට් පක්ෂය 28.9%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් සභාව තුළ විශාලතම පක්ෂය බවට පත් වී තිබේ. මේ අනුව නගර සභාවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාව වූ ආසන 48න් 15ක්ම දිනා ගැනීමට ඔවුහු සමත් වී සිටී. අවුරුදු 17ක් පුරා නගර සභාවේ බලය හිමි කර ගෙන සිටි ඔස්ට්‍රියාවේ ජනතා පක්ෂයට ලැබී ඇත්තේ 25.7%ක ඡන්ද ප්‍රතිශතයක් සහ ආසන 13ක් පමණි. මෙම මැතිවරණයේදී කොමියුනිස්ට් පක්ෂයේ ඡන්ද ප්‍රතිශතය 8.5%කින් සහ ආසන ගණන 05කින් වැඩි වී ඇති අතර ජනතා පක්ෂයේ ඡන්ද ප්‍රතිශතය 12%කින් සහ ආසන ගණන 06කින් අඩු වී තිබේ.

## ෆින්ලන්තය: ප්‍රවාහනය බේරාගැනීමට වැඩවැරුමක්



ෆින්ලන්තයේ අගනුවර වන හෙල්සින්කි නගරයේ පොදු ප්‍රවාහන සේවාව පෞද්ගලීකරණය කිරීමට ගන්නා වූ උත්සාහයට එරෙහිව එරට මෙට්‍රෝ සහ ට්‍රෑම්ප් රථ සේවකයෝ දෙදින වැඩවර්ජනයක නිරත වූහ. දැනට හෙල්සින්කි නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන නගරයේ මෙට්‍රෝ, ට්‍රෑම්ප් රථ හා ජල ප්‍රවාහන සේවාව කොටස් දෙකකට වෙන් කර සීමිත සමාගම් බවට පත් කිරීමට යෝජනා වී තිබේ. මීට පෙර නගරයේ බස් රථ සේවාවද පැවතියේ පොදු අයිතියේය. පසුව එය වෙනම සමාගමක් බවට පත් කරනු ලැබීය. ඉන් අනතුරුව එය පෞද්ගලික සමාග මක් වන ෆින්ලන්ත බස් සමාගම විසින් අත්පත් කර ගනු ලැබිණි.

## ඕස්ට්‍රේලියාව: චීන විරෝධී හවුල සබ්මැරීන් අවුලකට



පසුගිය සැප්තැම්බර් 15වනදා ඕස්ට්‍රේලියාව, එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍යය ත්‍රෛපාක්ෂික ආරක්ෂක සහයෝගීතාවක් ආරම්භ කරන ලදී. මෙම සහයෝගීතාවේ අරමුණ ලෙස ප්‍රකාශ කර තිබුණේ ඉන්දු පැසිෆික් කලාපයේ ආරක්ෂාව හා ස්ථාවරත්වය සුරැකීමය. එම එකඟතාවේ ප්‍රධාන ආරම්භක පියවර ලෙස ඕස්ට්‍රේලියාව වෙත න්‍යෂ්ටික සබ්මැරීන බලකායයක් ලබා දීමට අදහස් කෙරේ. එහෙත් මෙහි සැබෑ අරමුණ වන්නේ කලාපය තුළ චීන බලපෑම යටපත් කරමින් එක්සත් ජනපද ආධිපත්‍යය තහවුරු කර ගැනීම බව පෙනේ.

මෙහිදී ඕස්ට්‍රේලියාව, එක්සත් ජනපදය සමග න්‍යෂ්ටික සබ්මැරීන මිලදී ගැනීම පිළිබඳ එකඟතාවට පැමිණෙන්නේ එරට ප්‍රංශයේ ඩීසල් සබ්මැරීන මිලදී ගැනීම සඳහා වූ එකඟතාව කඩ කරමිනි. මෙම සිදුවීමත් සමග ප්‍රංශය, ඕස්ට්‍රේලියාව සහ එක්සත් ජනපදය සමග ගැටුමකට පිවිස ඇති අතර ඊට එකට එක කිරීමක් වශයෙන් කියුබාවේ එන්නත් නිෂ්පාදනයට යුරෝ මිලියන 45ක් ලබා දීමටත් චීනයේ සයිනොෆාර්ම් එන්නත ප්‍රංශය තුළ භාවිතා කිරීමට අවසර දීමටත් තීරණය කර තිබේ.

## සම්බාධක පරදවන්න ජාත්‍යන්තර එකමුතුවක්



එක්සත් ජනපදයේ සහ යුරෝපා සංගමයේ සම්බාධකවලට මුහුණ දී සිටින රටවල් 18ක් සැප්තැම්බර් 23දා නිව්යෝර්ක් නුවරට රැස් වී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තිය ආරක්ෂා කරන මිතුරු රටවල් කණ්ඩායම ගොඩ නැගීය. මෙම කණ්ඩායමේ අරමුණ වන්නේ එක්සත් ජාතීන්ගේ සංගමයේ මූලධර්ම වූ බහු පාර්ශ්විකභාවය හා ජාතික ස්වෛරීභාවයට ගරු කිරීම ආරක්ෂා කර ගැනීමට මැදිහත් වීමයි.

# සංචිත අර්බුදය හමුවේ උඩු යටිකුරු වූ ලංකාවේ ආර්ථිකය

ලංකාවේ යළිත් පොලිම් යුගයක් පැමිණ ඇත. ඒ සමෘද්ධිය සහනාධාර හෝ කොරෝනා එන්නත විද ගැනීමට නොවේ. ඒ පෝලිම්ද පසුගියදා ඇති තරම් තිබුණි. මේ අලුත්ම පෝලිම් පාර දෙපස ඇත්තේ වැඩි මිලට හෝ කිරි පිටි පැකට්ටුවක්, ගෑස් සිලින්ඩරයක්, සීනි කිලෝ එකක් ලබා ගැනීමටය.

අද අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ ඇතුළු සියලුම පරිභෝජන භාණ්ඩ මිල ඉහළ යන්නේ රොකට් වේගයටත් වැඩි වේගයෙන් යැයි කිවහොත් එය අතිශයෝක්තියක් නොවන තරමය. මීට මාස 17කට කලින් ඇසුණු "සෞභාග්‍යයේ දැක්මේ" ගෝඨාභයගේ ආර්ථික දර්ශනය උපුටා ගැනීම මාධ්‍යවලවත් දකින්නට නැත. මැතිවරණ වේදිකාවේ අඩු මිලට බඩු විකිණූ වීරවංශගේ ලැයිස්තුවත් නැත. සහන දෙන බව කියූ අයද දකින්නට නැත.



"නව සමාජ පංතියකට, විශේෂයෙන්ම මේ දක්වා දුප්පත්කමෙන් හා නූගත්කමෙන් පරිපීඩිතව සිටි පංතියකට, නව තත්වයට පුරුදු වීම, වටපිටාව ගැන අවබෝධ කර ගැනීම සහ තමන්ගේ වැඩ සංවිධානය කර ගැනීම හා තමන්ගේම සංවිධායකයන් ඉදිරිපත් කිරීම සඳහා සති ගණන් නොව දීර්ඝ මාස ගණන් හා අවුරුදු ගණන් කාලය අවශ්‍ය වනු ඇත."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**8වැනි වෙළුම, 59 පිටුව**

## බැරි වුණේ කොරෝනා නිසාද?

තවමත් ගෝඨාභය රාජපක්ෂ පාලනයද ක්‍රියාත්මක කරන ආර්ථික, දේශපාලන ප්‍රතිපත්තීන් අසාර්ථක යැයි පිළිගැනීමට මැළිකමක් දක්වන රාජපක්ෂලාටත් වඩා රාජපක්ෂවාදීන් හිත හදාගැනීමට තර්ක කරනුයේ, කොරෝනා නොතිබුණා නම් ආණ්ඩුව මේ අමාරුවේ වැටෙන්නේ නැති බවයි. ඔවුහු කොරෝනාවලටත් කලින්ම ආර්ථික වර්ධනයේ ඍණ වීම අරඹා තිබූ බව අමතක කරති. 2010 සිට වසරකට ඩොලර් බිලියන බැගින් ලබාගෙන තිබුණු ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර සඳහා ගෙවීම කිරීමට කල්පිරීම 2020 අග සිට සිදුවන බව නොදැන සිටි අය ලෙස කථා කරති.

ආනයන-අපනයන අතර පරතරය, ඩොලර් බිලියන 10ක් වනවිට, සංචාරක කර්මාන්තයෙන් හා විදේශගත ශ්‍රමිකකයන්ගෙන් ඒ හා සමානව ඩොලර් බිලියන 10ක් පමණ ලැබීමෙන් අර්බුදය ප්‍රකාශයට පත්වීම තාවකාලිකව පියවා ගත්තද අළුයට ගිනි මෙන් මේ ණය කන්ද පුපුරා යාමේ ඉමට පැමිණෙමින් තිබුණි. සංවර්ධනය ගැන, සෞභාග්‍යය පිළිබඳව වහසි බස් දෙඩුවන්ට ඇතිවෙමින් තිබූ විදේශ විනිමය අර්බුදය (ඩොලර් හිඟවීමේ අර්බුදය) පිළිබඳව කිසිදු තැකීමක් නොවීය. කොවිඩ් තත්වය විසින් සිදු කළේ අලුත් අර්බුදයක් ඇති කිරීමට වඩා පැවති අර්බුදය හෙළිදරව් කිරීමය. මීට කලින් අර්බුදයේ ප්‍රකාශනය යුද්ධය වූ අතර දැන් එය කොරෝනා වසංගතයට මාරු වී ඇත. වෙනස එපමණය.

## විනිමය අර්බුදයේ ප්‍රතිඵල

ලංකාවේ ඇතිවූ ඩොලර් අර්බුදයත් සමග රුපියල ඉතා වේගයෙන් බාල්දු වීමට පටන් ගැනිණි. අගෝස්තු මාසයේදී පමණක් රුපියල 6.9%කින් බාල්දු වී ඇත. 2021 ජනවාරි මාසයේදී ඩොලරයක් රු. 150 මට්ටමේ පැවති අතර 2021 සැප්තැම්බර් වන විට මහ බැංකුව ප්‍රකාශයට පත්කළ නිල අගය වූයේ රු. 203කි. රු. 203ක ස්ථාවර සීමාවට ඩොලරය පවත්වාගත යුතු යැයි මහ බැංකුව නියෝගය නිකුත් කළද බැංකු පද්ධතිය සතු (රාජ්‍ය හා පෞද්ගලික බැංකු) ඩොලර් හිඟ වීම නිසා රාජ්‍ය බැංකු සමග ගනුදෙනු කරන ගනුදෙනුකරුවෝ බරපතළ අර්බුදයකට පත්වූහ. සාමාන්‍ය ලෙස ආනයන කටයුතු




කිරීමේදී භාණ්ඩ ලංකාවට ගෙන්වන තැනැත්තන් තම සැපයුම්කරුවන්ට ගෙවීම කරන ක්‍රම කිහිපයක් වේ. ඒ කවර ක්‍රමයට ගෙවීම කළද එම ගෙවීම කළ යුතු වන්නේ ලංකාවේ බැංකු පද්ධතිය මගිනි. භාණ්ඩ ආනයනය කරන තැනැත්තෙකු විදේශ රටක සැපයුම්කරුවකුගෙන් පරිප්පු, තිරිඟු පිටි, සීනි වැනි කවර ද්‍රව්‍යයක් ඇනවුම් කළද ඒ සඳහා තමන්ගේ ලංකාවේ බැංකුවත් සමග එකඟතාවයකට පැමිණිය යුතුය. අදාළ ආනයනකරු වෙනුවෙන් ගෙන්වන භාණ්ඩ සඳහා ලංකාවේ බැංකුවේ ඩොලර් ප්‍රමාණවත් තරම් තිබේ යැයි සහතික කර භාණ්ඩ සපයන සැපයුම්කරුවන්ගේ බැංකුවට දන්වා යැවිය යුතුය. භාණ්ඩ සැපයුම්කරු (පිටරටක පුද්ගලයා) එම භාණ්ඩ ඉල්ලුම් කළ ඉන්වොයිස් සමග සැපයීමේ ලේඛන ලංකාවේ බැංකුවට ලබාදීමෙන් පසු භාණ්ඩ මුදාගැනීමට ආනයනකරුට හැකියාව ලැබේ.

> ආර්ථිකය හැදීමට ඇති වැඩපිළිවෙළ දේශපාලනය හැදීමට ඇති වැඩපිළිවෙළේම කොටසක් ලෙස තේරුම් නොගෙන, මේ ජරාජීර්ණ දේශපාලන ක්‍රමය මෙලෙසම පවත්වා ගනිමින් ආර්ථිකය වෙනස් කළ හැකි යැයි සිහින මැවීම තවදුරටත් පලක් නැත. අර්බුදයට කෙටි කාලීන විසඳුමක්, මධ්‍ය කාලීන හා දිගු කාලීන විසඳුම් ක්‍රමද රැඳී ඇත්තේ දේශපාලන ක්‍රමයේම වෙනසක් සහිතව මානව සහ ස්වභාවික සියලුම සම්පත් එකට ගෙන සැලසුම් කිරීමේ ක්‍රියාවලියක් තුළය.

භාණ්ඩ වරායට පැමිණි පසු භාණ්ඩ මුදා ගැනීමේ ලේඛන (නිෂ්කාශන ලිපි) බැංකුවෙන් ලබාගෙන වරායෙන් භාණ්ඩ නිදහස් කරගත හැකිය. මෙම භාණ්ඩ ආනයනය කිරීමේ සාමාන්‍ය ක්‍රියා පිළිවෙත වන අතර, භාණ්ඩ ලංකාවට ගෙන්වන ආනයනකරුවන් විසින් මුදල් ගෙවා පියවීමේ ක්‍රම කිහිපයක්ම ඇත. බැංකුව හරහා ණයවර ලිපි (බක්) විවෘත කර භාණ්ඩ ලැබුණු පසු එම භාණ්ඩ විකුණා මුදල් බැංකුවට ගෙවීම ඉන් එක් ක්‍රමයකි. එය බැංකුව සහ ආනයනකරු අතර ඇතිවන විශ්වාසය මත සිදුවන්නකි. එසේම, සැපයුම්කරු හා ආනයනකරු අතර එකඟතාවය මතද විකුණා මුදල් ගෙවීමේ පදනමට භාණ්ඩ එවිය හැකිය. එහෙත් එයද සිදුවිය යුත්තේ බැංකු ක්‍රියාවලිය හරහාමය. අවසානයේ ලංකාවටට භාණ්ඩ ගෙන්වීම (ආනයනය) තීරණය වන්නේ, බැංකු පද්ධතිය සතු ඩොලර් ප්‍රමාණය මතය.

ආණ්ඩුවටද ඩොලර් අවශයය. ඒ ඩොලර්වලින් ලබාගෙන ඇති ණය පියවා දැමීමටය. නැත්නම්, වාරිකවල ණය පොලී ගෙවීමටය. ඒ සඳහා ආණ්ඩුව වෙනුවෙන් මහා භාණ්ඩාගාරය මහ බැංකුවෙන් ඩොලර් ඉල්ලුම් කරනු ලැබේ. මහ බැංකුව, වාණිජ බැංකුවල ඇති ඩොලර් ලබාගත යුතුය. නැතහොත්, මහ බැංකුව සතු විදේශ වත්කම් සංචිතයෙන් ආණ්ඩුවට ඩොලර් නිකුත් කළ යුතුය. මහ බැංකුව සිදුකරන්නේ ආණ්ඩුවට ණයක් සැපයීමය. එය මහ බැංකුවට කළ හැක්කේද මහ බැංකව සතුව ප්‍රමාණවත් ඩොලර් සංචිතයක් ඇත්නම් පමණි.

මහ බැංකුව නිකුත් කරන සෑම ඩොලරයක වටිනාකමට මහ බැංකුව ආණ්ඩුව ණය ගෙවන තුරු තමන්ට වත්කමක් ලෙස මුද්‍රණය කර ඇති මුදල්වලින් රුපියල් ප්‍රමාණයක් (ඩොලරයට හුවමාරු අගයට අනුව) වෙන්කර ගනී.

මේ ක්‍රියාවලිය අර්බුදයට ගොස්, අද වනවිට විනිමය අර්බුදයක් බවට පත්ව ඇත්තේ ආණ්ඩුවේ ණය ගෙවීමට හෝ රටට අවශ්‍ය භාණ්ඩ ආනයනයට ප්‍රමාණවත් වත්කම් ලෙස මහ බැංකුව සතුව විදේශ විනිමය නොවීමයි. මහ බැංකුවේ ප්‍රධානම වගකීමක් වී ඇත්තේ රටේ මූල්‍ය ස්ථාවරභාවය රැක ගැනීමයි. වර්තමානයේ ප්‍රායෝගික තලයේදී ආණ්ඩුවට පක්ෂග්‍රාහී වුවද, මහ බැංකුව ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියා කළ යුතු වන්නේද ඒ සඳහාය. මේ වන විට මහ බැංකුව සතු සමස්ත විදේශ විනිමය ප්‍රමාණය ඩොලර් මිලියන 3550.7ක් (2021 අගෝස්තු අවසානයට) බවට පත්ව ඇත. එය පසුගිය ජූලි මාසයේදී ඩොලර් මිලියන 2806ක්විය. 2021 ආරම්භයේදී ඩොලර් මිලියන 7300ක් පමණ මට්ටමේ පැවති මෙම සංචිතය දිගින් දිගටම ආණ්ඩුවේ අවශ්‍යතාවයට ණය ගෙවා පියවීමට මුදා හැරීමට සිදුවීමත්, බැංකු පද්ධතිය සඳහා අවශ්‍ය ඩොලර් සම්පාදනයට යෙදවීමත් නිසා මෙම කඩා වැටීම සිදුවිය. එසේම, එම වියදම කරන ඩොලර් සඳහා ලැබිය යුතු අපනයන ආදායම්, විදේශගත ශ්‍රමිකයන්ගෙන් ලැබීම්, සංචාරක කර්මාන්තයේ ඉපයීම මගින් ලැබෙන ලැබීම් බිඳ වැටීමත් නිසා ලංකාවේ ඩොලර් හිඟය ඉතා ප්‍රබල අර්බුදයක් බවට මේ වනවිට පත්ව ඇත. ජූලි මාසයේ අවසානයට විදේශ වත්කම් පැවතියේ ඩොලර් බිලියන 2.8ක් පමණි. එයින් මාසයක් ඇතුළත ඩොලර් මිලියන 260ක්ද මාස 04කක් ඇතුළත ඩොලර් බිලියන 1.4ක්ද ඉදිරියට ගෙවීමට ඇති විදෙස් ඩොලර් ණය වෙනුවෙන් පියවිය යුතුය.

මීට අමතරව මාසයකට සාමාන්‍යයෙන් ආනයන සඳහාද ඩොලර් බිලියන 1.6ක් පමණ වැයවේ. පසුගිය ජනවාරි සිට ජූලි දක්වා ආනයන වියදම ඩොලර් මිලියන 11,724කි. ආනයන කොතෙක් සීමා කිරීම කළද පසුගිය මාස 07 තුළද අපනයන ආදායම (ඩොලර් මිලියන 6802) ඉක්මවා සිදු කර ඇති ආනයන වියදම ඩොලර් මිලියන 4922කි.

ණය ගෙවිය යුතු වන්නේ එක්කෝ ණය ගෙවීමට ණය ලබාගෙනය. නැතහොත්, විදේශ වත්කම් සංචිතයෙන්ය. වෙළඳ ශේෂයේ හිඟය පියවිය යුත්තේද එක්කෝ ණය ලබාගෙනය. නැතහොත් විදේශ විනිමය සංචිතයෙන්ය. දැන් මේ සියල්ල කිරීමට ආණ්ඩුවට අලුතින් විදේශ විනිමය ලෙස එකතු වී ඇත්තේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලද විදේශ ගිණුම් හිමිකම් ණය පහසුකම පමණි. එම පහසුකම ඩොලර් මිලියන 554ක් ඩොලර් වත්කම් බවට හුවමාරු කරගෙන විදේශ වත්කම් සංචිතය අගෝස්තු මාසයේ අවසානයට ඩොලර් බිලියන 3.5ක් දක්වා ඔසවා ගැනීමට ආණ්ඩුව හැකිවිය. නමුත්, ඒ විශාල ආනයන සීමාකම් කිරීමක් යටතේය.

## 100%ක් තැන්පතු සීමාව

ලංකාවට ගෙවන අත්‍යවශ්‍ය භාණ්ඩ 662ක් ලැයිස්තුවක් අත්‍යවශ්‍ය නොවන ලෙස වර්ගීකරණයක් කර ආනයනකරුවන් විසින් එම භාණ්ඩ ගෙන්වන්නේ නම්, භාණ්ඩවල වටිනකම 100%ක් වටිනා ප්‍රමාණයේ මුදල් තැන්පතුවක් බැංකුවලට තැබිය යුතු යැයි පසුගියදා ආණ්ඩුව නියෝගයක් පැනවීය. ඒ නියෝගය ක්‍රියාත්මක කළ හැක්කේ ආනයනකකරුවන් කිහිප දෙනෙකුට පමණි. කලින් පැහැදිලි කළ පරිදි, ණයවර ලිපි ක්‍රියාවලියේදී බැංකු සමග එකඟතාවයකින් භාණ්ඩ ආනයනය කර ගෙවීම් පියවන බොහෝ ව්‍යාපාරිකයන්ට මේ නිසා අර්බුද රැසකට මුහුණ දීමට සිදුවිය. ඔවුන්ට ආනයන කිරීමට හැකියාවක් නැතිකම නිසා දේශීය වෙළඳපොළේ

*10 වැනි පිටුවට*

# අලුත් දේශපාලන මාවතක් ආරම්භ කිරීමට අපි සූදානම්

සමන්මලී ගුණසිංහ
ජාතික සංවිධායිකා
සමාජවාදී කාන්තා සංගමය

රටේ ආර්ථිකය ශක්තිමත් කරන ගැහැනිය පවුලේ බර පොදිය උසුලන ගැහැනිය අසමත් පාලකයන් විසින් මහ පාරේ පෝලිම්වලට ඇදලා දාලා. තුන් වේල බුදින පාලකයෝ අපිට කියනවා පටි තද කරගන්න කියලා. අවුරුදු හැත්තෑ තුනක් පොඩි කරන සුදුළූණුවලට එරෙහිව තමයි කාන්තාවෝ අද පාරට බැහැල තියෙන්නේ. හැම අරගලයකම පෙරමුණේ ඉන්නේ කාන්තාවෝ. අලුත් දේශපාලන මාවතක් ආරම්භ කිරීමේ බලාපොරොත්තුවට පන්නරය දීමට කාන්තා සංගමයේ අපි සූදානම්.



# ඉරණමට එරෙහිව සටන් වදින්නෝ




ගැබිණි මව්වරුන් ගණිකා වෘත්තියේ යෙදෙන්නේ යැයි ඔබ ඇසුවහොත් ඔබ කම්පනයට පත්වනු නිසැකය. එසේ තමා උසුලාගත නොහැකි බර වැඩක යෙදුනත් ඔබට 'අනේ අපොයි' කියා කියැවෙනු ඇත.

කුසගින්න උසුලාගත නොහැකි ගින්නක් නිසාම කුසගිනි නිවා ගැනීම වෙනුවෙන් ලැජ්ජාව සහ බය පසෙක තබා ඕනෑම දෙයක් කරන්නට මිනිසුන් පෙළඹේ. එයට ගැහැනු පිරිමි කියා බේදයක් නැත.එහෙත් කාන්තාවගේ පාර්ශවයෙන් ගතහොත් පොදුවේ ඔවුන් තම කුටුම්බ තුළින් මෙන්ම සමාජයෙන්ද කාන්තාවක් වීම නිසාම විවිධ පීඩාවන්ට පත්වේ. එනිසාම එකම සමාජ විරෝධී ක්‍රියාව පිරිමියෙක් සිදුකළ විට එක ආකාරයකුත් ගැහැනියක් සිදු කළ විට තව ආකාරයකටත් බැලීමට සමාජය පුරුදු වී සිටී. එනිසාම ගැබිණිභාවයේ සිටින මව්වරුන්ටද ඇඟ මස විකුණන්නට තරම් මේ ආර්ථික ක්‍රමය ම්ලේච්ඡ හා තුච්ඡ වී ඇති බවට වඩා පොදුවේ සමාජ මනෝ භාවය සකස් වී ඇත්තේ ගැබිණි මව්වරු එවැනි ක්‍රියාවල නිරත වීම මහපොළොව නුහුලන අපරාධයක් බවටය.

කොරෝනා වසංගතය ලෝක පරිමාණව ධනවාදී ආර්ථික ක්‍රමයේ අර්බුදය, සම්පත් බෙදීයාමේ විෂමතාවය මෙන්ම එයින් ව්‍යුත්පන්න වන සමාජීය අර්බුද පෙන්වන කැඩපතකට වඩා අන්වීක්ෂයක් වූවා යැයි කීම වඩාත් යෝග්‍යවේ. මේ තත්වය තුළ කාන්තාවන්ට හා ළමුන්ට එල්ලව ප්‍රචන්ඩත්වය පිම් ගණනාවකින් ඉහළ ගොස් ඇති අතර පසුගාමී ධනේශ්වර සංවර්ධනයක් ඇති රටවල මෙන්ම දියුණු ධනපති රටවලද තත්වය මෙසේය.

එසේම අපේ රටේද 73 වසරක ධනපති පාලනයෙන් අවසානයේ උරුමකර දී ඇත්තේ ගැබිණි මව්වරුන්ට ගණිකා වෘත්තියයි. කොරෝනා වසංගතව තුළ පොදු ජනතාව පීඩාවට පත්වෙද්දී, රටේ පාලකයන් මෙන්ම ඔවුනගේ හිතවත් සමාගම් ලාභ කඳු ගොඩ ගහමින් සිටී.

මෙතෙක් කලක් මේ පීඩනය තම උරුමයක් සේ සිතා මුනිවත රැකි කාන්තාවන් දැන් ඊට එරෙහිව සටන් කරන්නට පෙළඹී ඇති බවක් පෙනෙන්නට තිබේ. ඉහළ යන බඩු මිල, ගෑස් හිඟය, කිරිපිටි හිඟය ආදිය ගෙදර කුස්සියට පහර පිට පහර එල්ල කරද්දී ගැහැනුන් 'අවි අමෝරා' ගැනීම පුදුමයක් නොවේ. ගෑස් පෝලිම්වල හිඳ ගෑස් නොලැබී භූමිතෙල් ලිපට මාරු වෙන්නටද, ඒ වෙනුවෙන් භූමිතෙල් පෝලිම්වල වරු ගණන් තපින්නටද වේල් තුනක් වෙනුවට ආණ්ඩුවේ ඇමතිවරයෙක් කියූ සේ හොද්දක්, බතක් උයාගෙන වේලක් කන්නටද සිදුවීමත් නිසා ගෘහනියන්ගේ කෝපය ආණ්ඩුව වෙත එල්ලවී තිබේ. දරුවන්ට කිරි උගුරක් ලබාදෙන්නට කිරිපිටි පැකට්ටුවක් ගන්නට පෝලිමක හිඳ අවසානයේ කිරිපිටි නැතිව හිස් අතින් ගෙදර යන්නට සිදුවූ විට 'මේ ආණ්ඩුව පත්කෙරුවෙත් අපි මුං ගෙදර යවන්නෙත් අපි, මුංට ඡන්දෙ දුන්නට අපිට ගහන්න ඕනෑ' යනුවෙන් විරෝධය පානු දක්නට ලැබේ.

විශේෂයෙන් මේ වන විටත් රට පුරා ක්‍රියාත්මක වන ගුරු අරගලය තුළ කාන්තා නියෝජනය කැපී පෙනෙන ලෙස වැඩි අගයක් ගෙන තිබේ. ඒ හුදු වැටුප් විෂමතාවය නිසාම නොවේ. සොච්චම් පඩියෙන් ජීවත්වන්නට නොහැකි ලෙස මෑත කාලීනව ජීවන වියදම ඉහළ යාම එයට හේතුවකි. එසේම Online අධ්‍යාපනයේදී ගුරුවරියන් ලෙස, හා මව්වරුන් යන දෙපාර්ශ්වයෙන්ම විඳින්නට සිදුවන ගැටලුද මේ සඳහා බලපා ඇති බව නොරහසකි. පාලකයන් හා පාලකයන්ට ආවඩන සමහර මිනිසුන්ගේ නින්දා අපහාස, මඩ අවලාද තර්ජනයන් හමුවේ, ඒවාට ධෛර්ය සම්පන්නව මුහුණ දෙමින් ගුරුවරියන් නොබියව පාලකයන්ට එරෙහිව පාරට බැස්සෝය. මෑත ඉතිහාසයේ ආණ්ඩුවට විරුද්ධව සිදුවූ අරගලයන් අතර වැඩිම කාන්තා නියෝජනයක් ඇති අරගලය ගුරු අරගලයයි.

69 ලක්ෂයක ජනතාවගේ ආශීර්වාදයෙන් 'හොඳටම කරන්නට බලයට පත්වූ ජනාධිපතිවරයාත් 2/3ක බලයක් සහිත ආණ්ඩුවත් දැන් ජනතාවගේ පමණක් නොව රටේම ගෙලට තොණ්ඩුව දමා ඇති බව නොවැටහෙන කිසිවෙකුත් නැති තරම්ය. බහුතර ඡන්දදායකයන් වූ ගැහැනුන් පාරට බසින්නට මැලි නොවන්නේ එබැවිණි.

එය කාන්තාවන් සම්බන්ධයෙන් වූ සාධනීය තත්වයකි. සුපුරුදු ලෙස 'අපි හම්බ කළොත් අපි කනවා' යන ආකල්පයෙන් බැහැර වී ඇති බව පෙන්වන අවස්ථාවකි. 'හම්බ කරන දෙයින් කන්නට නොහැකි බව දැන් බොහෝ කාන්තාවන්ට වැටහී ඇති බවට සැකයක් නැත. පොහොර නැති විට, එළවළු විකුණාගත නොහැකි විට ගොවියන් සමග බිරින්දෑවරුන්ද, Online පහසුකම් නැතිවිට මව්වරුන්ද බඩු මිලට එරෙහිව ගෘහණියන්ද පාරට බසින්නේ එබැවිනි. එය සියලු දේ 'කරුමයට' බාරදී පීඩාවන් දරාගත් කාලය අවසන් බව කියැවෙන සංඥාවකි.

ආණ්ඩු තනන්නට හරි හරියට දායකත්වය දුන් ගැහැනුන්ගේ සටන්කාමීත්වය හෙට දිනයේදී තවත් ආණ්ඩු පෙරළියකින් ඔබ්බට ගිය අර්ථාන්විත සටන්කාමීත්වයක් දක්වා පෙළ ගැසිය යුතුව තිබේ. එදා සෝවියට් සමාජවාදී පාලනයට ඇලෙක්සැන්ඩ්‍රා කොලොන්තියා කළ යෝජනා මෙන් ලාංකේය කාන්තාවන්ගේ 'බර පොදිය' සමාජය විසින් බාර ගන්නා පාලනයක් ඇති කර ගැනීමේ වගකීමේ සැලකිය යුතු කොටසක් කාන්තාවන්ට පැවරී ඇත. එවැනි පාලනයක් තුළ ගැහැනුන්ගේ පීඩනය අවසන් වන නිසා ගැහැනියට වෘත්තීය ජීවිතය පවුල් ජීවිතය හා සමාජයීය ජීවිතය ද සමබරව පවත්වා ගැනීමේ අවස්ථාව උදාවනු ඇත. එවිට ගැහැනුන් බැඳ ඇති යදම් බිඳෙනු ඇත.



## දුෂ්කරක්‍රියා

ගත වැරහැලි මත හසරැළි පිපෙන්නී
ලිප ගිනි දැලි හද තුළ අවුළුවන්නී
හද පතුලැ'ති සෙනෙහස පුද කරන්නී
නෙත කඳුළැලි සුසුමෙන් පිස දමන්නී

අන් සැප පතා හැම විටදිම සැප වැරුවා
තුන් තිස් පැයේ ජීවන බර කර ගැහුවා
යනඑන මග තොටේ නෙක අවමන් දැරුවා
සඳුට හොරෙන් තරු කැට පින්නෙන් පිරුවා

රජුන් තනා කෑ කිරිබත් ලොවක් දනී
එලොව වෙසෙන අපි කෑ හැටි ලිපා දනී
නොපා අත්ල, ගෙදරට බත සදනු රිසී
නරකාදියක ස්පා සුරපුරක් දිටී

අනුන් දෙන බතට වග පල ඇසුවාට
රජුන් අහක බැලුවට හිත් රිදුනාට
දනින් නොවැටි දෙපයින් නැගිටින දාට
දොහොත් මුදුන් දෙමු බැතියෙන් අම්මාට

# සිව්දෙසින්

## සිම්බාබ්වේ ළමා මනාලියන්




පසුගිය ජුලි 15 වනද 14 වියැති දැරියක් දරු උපතක් සිදු කිරීම අතරතුර මියයාම සහ පල්ලිය විසින් ඇයගේ සිරුර රහසේ මිහිදන් කිරීම හෙළිවීමත් සමග ළමා මනාලියන් පිළිබඳ ගැටලුව සම්බන්ධව නැවත සිම්බාබ්වේ තුළ කතාබහක් ඇතිවී තිබේ. ඇනා මචායා නම් මෙම දැරිය වයස අවුරුදු 13 දී පාසල් ගමන නතර කරවා බලහත්කාරයෙන් විවාහයට පත්කර තිබේ.

සිම්බාබ්වේ විවිධ ප්‍රදේශවල විශේෂයෙන් සමහර ස්වදේශික පල්ලි ආශ්‍රිතව බාල වයස්කාර දැරියන් විවාහ කර දීම සිදුවන අතර මෙම පල්ලි විසින් ඖෂධ සහ රෝහල්ද ප්‍රතික්ෂේප කරයි. 2016 නඩු තීන්දුවක් මගින් වයස අවුරුදු 18 ට අඩු දරුවන් විවාහයට ඇතුළත් කිරීම ව්‍යවස්ථාවට විරුද්ධ බව ප්‍රකාශ කරන ලදි.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ද සිම්බාබ්වේ රජයට ළමා විවාහ අපරාධ වශයෙන් නම් කරන ලෙසත් දැරියන් සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නවත්වන ලෙස ප්‍රකාශ කර තිබේ. විවිධ ප්‍රදේශවල ළමා විවාහ නැවැත්වීම සඳහා එහිම ගොදුරු බවට පත් වූ කාන්තාවන් අතරම සාකච්ඡා ඇතිවෙමින් ඇත.

## ඇෆ්ගනිස්ථාන කාන්තාවෝ




ඇෆ්ගනිස්ථානය තුළ නැවත තලේබාන් පාලනය ස්ථාපිත වීමත් සමග කාන්තාවන්ගේ නිදහස සැලකිය යුතු මට්ටමින් සීමා වන තත්ත්වයක් ඇතිවී තිබේ. මින් පෙර තලේබාන් පාලනය පැවති සමය තුළ කාන්තාවන්ට මුහුණද ඇතුළු සම්පූර්ණ ශරීරයම ආවරණය වන පරිදි ඇඳුම් අඳීමට සිදුවූ අතර ඔවුනට පිරිමියෙකු සමග මිස තනිව එළියට යා නොහැකි වන ලෙස නීති සම්පාදනය විය. මෙවරද තලේබාන්වරු පාලනය බලය අත්පත් කරගත් අවස්ථාවේද ප්‍රකාශ ඇත්තේ ශරියා නීතියට අනුව කාන්තාවන් ජීවත් විය යුතු බවය.

ඇෆ්ගනිස්ථානය තුළ මෙන්ම ජාත්‍යන්තරවත් බොහෝ දුරට එරට කාන්තාවන්ගේ නිදහස සම්බන්ධයෙන් කතාබහට ලක්වන නමුත් එම නිදහස තහවුරු කිරීමට වැඩපිළිවෙළක් නොමැති බව පෙනී යයි.

මෙලෙස සිය නිදහස තහවුරු කරන ලෙස ඉල්ලා විවිධ ප්‍රදේශ වල කාන්තාවෝ කණ්ඩායම් ලෙස ප්‍රසිද්ධියේ තලේබාන් පාලනයට විරෝධතාව ප්‍රකාශ කර සිටිති.

## මෙක්සිකෝවේ ගබ්සාව අපරාධයක් නොවේ




මෙක්සිකෝව තුළ වසර ගණනාවක සිට ගබ්සාව නීතිගත කරන ලෙස ඉල්ලා සාකච්ඡා, උද්ඝෝෂණ, සහ පෙළපාලි පැවැත්වුණි. පසුගියදා ඒකමතික තීන්දුවක් ලබා දෙමින් මෙක්සිකෝවේ උපරිමාධිකරණය ප්‍රකාශ කළේ ගබ්සාව අපරාධ වරදක් බවට පත් කිරීම ව්‍යවස්ථා විරෝධී බවයි. මෙම තීන්දුව හේතුවෙන් ගබ්සාව සම්බන්ධයෙන් නව නීති සම්පාදනය කිරීමට අවකාශයක් විවෘත වී ඇත. මෙතෙක් මෙක්සිකෝවේ පැවති නීතිය අනුව කුමන හේතුවක් යටතේ ගැබ් ගැනීමට ලක් වුවත් ගබ්සාවක් සිදු කළහොත් එය අපරාධ වරදක් සේ සලකන ලද අතර ගබ්සාවට ලක්වූ කාන්තාවට සිරගත වීමටද සිදු විය. මෙම නඩු තීන්දුව අනුව එවැනි චෝදනාවකට ලක්ව සිරගත වන කාන්තාවකට එකී නිලධාරීන්ට එරෙහිව නඩු මාර්ගයට අවතීර්ණ වීමේ හැකියාවක් ඇත. මෙම නඩු තීන්දුව ලතින් ඇමරිකානු අනෙකුත් රටවල නීති පද්ධතිවලටද බලපෑමක් වනු ඇත.

# රට නව දිශාවකට හරවන අලුත් දේශපාලන ගමනකට පිවිසෙමු

**ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා**

*ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා විසින් පසුගිය 13වැනිදා පස්වරුවේ අන්තර්ජාලය ඔස්සේ පවත්වන ලද 'කළු සල්ලි සුදු කරන බැසිල්ගේ ලොන්ඩරි පනත රට වෙනුවෙන්ද හොරු වෙනුවෙන්ද?' නම් දේශනයේ සංක්ෂිප්ත ලිඛිත සටහනකි මේ.*



පසුගිය 07 වැනිදා අපේ රටේ පාර්ලිමේන්තුවේදී විශේෂ පනතක් සම්මත කර ගත්තා. ඒ, කළු සල්ලි සුදු කිරීමේ නීති සම්පාදනය කිරීම වගේම විශාල ලෙස බදු කපා හැරීමේ යෝජනාවකින් සමන්විත මුදල් පනතයි. මේ යෝජනාව සම්මත කර ගන්න මොහොත වන විට රට පත්වෙලා තිබෙන තත්වය අපි දන්නවා. එක පැත්තකින් කොවිඩ් වසංගත තත්වය උත්සන්න වී තිබෙනවා. මේ නිසා දෛනිකව දහස් ගණන් ආසාදිතයන් වෙමින්, සිය ගණන් මිය යමින්ද බොහෝ දෙනෙක් නිවාසවල නිරෝධායනය වෙමින්ද සිටිනවා. රාජ්‍ය ආයතන සියල්ල වසා දමා තිබෙනවා. දෛනික ජීවිතය පවත්වාගෙන යාමේ අර්බුදයක් නිර්මාණය වී තිබෙනවා. භාණ්ඩ මිල ඉහළ ගොස් තිබෙන අතර භාණ්ඩ හිඟයක් ඇති වෙලා තිබෙනවා. මෙවැනි වෙලාවක පාලකයන් විසින් කළ යුතු වන්නේ කුමක්ද? ප්‍රධාන වශයෙන් කළ යුතුව තිබුණේ මෙම ගැටලු විසඳීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කිරීම සහ යෝජනා සම්මත කර ගැනීමයි. නමුත් වර්තමාන ආණ්ඩුව රටේ තත්වය උපයෝගී කරගෙන රටටත් ජනතාවටත් අහිතකර විශාල නීති ප්‍රමාණයක් සම්මත කර ගනිමින් යනවා. පොදු ජනතාවගේ අවධානය ඒ වෙත යොමු වන්නේ නැහැ. ඒ නිසා තමයි අපි කල්පනා කළේ, මෙම පනත සම්මත කර ගෙන අවසන් වී තිබුණත් මේ පනතින් රටට සිදුවන බලපෑම් පිළිබඳව යම් කරුණු ගණනාවක් ඔබත් එක්ක සාකච්ඡා කර ගන්න.

**කළු සල්ලි මැවීම**

පසුගිය ජනාධිපති ඡන්දයේදී සහ මහ මැතිවරණයේදී මේ පාලකයින්ට තමන්ට විරුද්ධව තිබෙන නඩු ඉවත් කර ගැනීමේ වුවමනාව තිබෙන බව අපි පැහැදිලි ලෙස පෙන්වා දුන්නා. ඔවුන්ට එරෙහිව මෙවැනි නඩු ගොඩක් තිබුණා. දැන් ඔවුන් සමහර නඩු නීතිපති දෙපාර්තමේන්තුවට ගිහිල්ලා ඉල්ලා අස්කර ගන්නවා. සමහර නඩුවල චෝදනා වෙනස් කරනවා. සමහර නඩු බහා තබනවා. සමහර නඩුවල විත්තිකරුවන් නිදහස් කරනවා. මේ බොහෝ අය අපරාධ නඩුවලට, වංචා දූෂණවලට හවුල් වුණු අය. ඔවුන් මුහුණ දීපු තවත් ප්‍රශ්නයක් තිබුණා. ඔවුන් නීති විරෝධීව එක්රැස් කරගෙන, දේශීයව හා විදේශීයව තිබෙන ධනය පිරිසිදු කර ගැනීමේ වුවමනාවක් ඔවුන්ට තිබුණා. ඒ නිසා තමයි මේ කළු සල්ලි සුදු කිරීමේ පනත සම්මත කරගෙන තිබෙන්නේ. මේ පනතේ පළමු අරමුණ තමයි හෙළිදරව් නොකරන ලද වත්කම් හෙළිදරව් කිරීම සඳහා අවස්ථාවක් ලබාදීම. දෙවෙනි කරුණ තමයි දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට නියමිත පරිදි ගෙවිය යුතු යුතුව තිබූ පසුගිය මාර්තු මාසයේ 31 දක්වා එක්රැස්වී තිබූ බදු කපා හැරීම.

මේ හෙළි නොකළ වත්කම් කියන්නේ එම වත්කම් උපයාගත් ආකාරය හෙළිදරව් කිරීමට හැකියාවක් නොමැතිකමයි. එසේ වන්නේ ඒ නීති විරෝධී ලෙස උපයා ගත් ධනය නිසයි. මේ හෙළි කළ නොහැකි වත්කම් තිබෙන්නේ කා ළඟද? මෙහි හෙළි නොකළ හැකි වත්කම් තිබෙන්නේ අතලොස්සක් වූ දේශපාලනඥයන් ළඟයි. ඒ වගේම දේශපාලකයන් සමග ඇලී ගැලී එම ධනය එක් රැස්කර ගැනීම සඳහා උදව් කළ අතලොස්සක් වූ නිලධාරී කණ්ඩායමක් ළඟයි. ආණ්ඩුවේ දේශපාලඥයන්ගේ රැකවරණය ලබමින් විවිධ අයථා ව්‍යාපාරවලින් මුදල් උපයා ගත් චෞර ව්‍යාපාරිකයන් අතලොස්සක් ළඟයි. කුඩු ව්‍යාපාරිකයන්, පාතාලකරුවන් මත්ද්‍රව්‍ය ව්‍යාපාරයේ යෙදෙන ජාවාරම්කාරයන් ළඟයි. ඔවුන් ළඟ මේ කළු සල්ලි තිබෙනවා.

අද අපේ රටේ කවුරුත් පිළිගන්නවා රජය මහා ඉදිකිරීම්වලින් විශාල ලෙස වංචා දූෂණ සිදුකොට ඇති බව. රජය විසින් මත්පැන් අලෙවි කිරීමේ බලපත්‍ර වැනි විවිධ බලපත්‍ර ලබාදීමේදී, දේශපාලකයන් විසින් බලපත්‍ර ලාභීන්ගෙන් විශාල ලෙස මුදල් ලබාගන්නවා. මේ ධනය මහා භාණ්ඩාගාරයට ආ යුතු ධනය. නැතිනම් මහා භාණ්ඩාගාරයෙන් වියදම් කරන ධනය, විශාල වශයෙන් ඔවුන්ගේ නිවෙස්වලට ඇදගෙන තිබෙනවා. සමහර ව්‍යාපෘතිවලට කළ වියදම ව්‍යාපෘතිය ඇතුළේ නැහැ. ඒවා විශාල ප්‍රමාණයක් තිබෙන්නේ දේශපාලනඥයන් අතලොස්සක් අතේ. ශැන්ගිලා හෝටලය ඉදිකිරීම සඳහා ඉඩම පවරාදීමේදී විශාල ධනයක් කොමිස් ලෙස ලබාගත් බට වාර්තා වී තිබෙනවා. ඒ වගේම කොටුව ප්‍රදේශයේ වටිනා ඉඩමක් ඉන්දියානු ක්‍රිෂ් සමාගමට හෝටල් ඉදිකිරීම සඳහා ලබාදීමේදී යටි ගනුදෙනු සිද්ධ වුණු බවට පරීක්ෂණ වාර්තාවලින් හෙළි වී තිබෙනවා. මේ ධනය භාණ්ඩාගාරයට ලැබිය යුතුව තිබෙන ධනයයි. පොදු ජනයාගේ ධනයයි. මේ ධනය ඔවුන්ට නීත්‍යානුකූල කර ගැනීමට බැරි තත්වයට පත්වෙලා. සමහර වත්කම් දේශීයවද සමහර වත්කම් විදේශීයවද තිබෙනවා.

**කළු, සුදු කරන මඟ**

බැසිල් රාජපක්ෂ පසුගිය හත්වැනිදා පාර්ලිමේන්තුවේ සම්මත කර ගත් මෙම පනත මගින් ඒ සියලු කළු ධනය නීත්‍යානුකූල කෙරෙනවා. භාණ්ඩාගාරයට ලැබිය යුතු ධනය, භාණ්ඩාගාරයේ තිබුණු ධනය. අතලොස්සක් අතට පැහැරගෙන තිබෙනවා. මුදල් විශුද්ධිකරණ පනත මගින් හෝ අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව මගින් අයථා ලෙස උපයා ගන්නා දේපළ පිළිබඳව පරීක්ෂණ කොට, නඩු පවරා යළි අත්පත් කර ගැනීමේ හැකියාවක් තිබෙනවා. මේ සම්මත කරගත් පනත මගින් සිදුවන්නේ මේ නීති විරෝධී ලෙස උපයා ගත් ධනය නීත්‍යානුකූල කර ගැනීමට බාධාවකින් තොරව අවස්ථාව හිමිවීමයි.

මේ නීත්‍යානුකූල කර ගැනීම මගින් ආණ්ඩුවට ලැබෙන්නේ 1%ක නාමික බද්දක් පමණයි. මේ සිදුවී තිබෙන්නේ තමන් විසින් තමන්ට නීති සම්පාදනය කර ගැනීමයි. මෙම මුදල් කොටස් වෙළඳපොළේ, භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරන්න පුළුවන්. එහම නැත්නම් මේ වසරේ දෙසැම්බර් 31 දක්වා වෙනකම් බැංකුවේ තැන්පත් කරන්න පුළුවන්. මෙම වත්කම් දේශීයව නිවාස ලෙස, ඉඩම් ලෙස, විවිධ ආදායම් මාර්ග ලෙස, මුදල් ලෙස තිබිය හැකියි. මේ අයථා ධනය විදේශීයව තිබිය හැකියි. පසුගිය කාලයේ මේ කළු සල්ලි විශාල ආන්දෝලනයකට තුඩු දුන්නා. පැනමා පේපර්ස්වලින් හෙළිදරව් වුණා. සීෂෙල්ස්වල තිබෙන බවට හෙළිදරව් වුණා. ඩුබායිවල ගිණුම්වල වාර්තාවල තිබෙන බවටද ස්විස් බැංකුවල තිබෙන බවටද වාර්තා වුණා. මේ අයථා මුදල් පිටරටට ඇදගෙන ගොස් තිබෙනවා. එමනිසා මේ පනතින් අවස්ථාවක් දෙනවා දේශීයව හා විදේශීයව තිබෙන කළු ධනය සුදු කර ගැනීමට.

විදේශිකයන් සතුවත් නීති විරෝධීව උපයාගත් ධනය තිබෙනවා. කුඩු ජාවාරම්වලින්, මත්ද්‍රව්‍ය ජාවාරම්වලින්, නීති විරෝධී අවි ජාවාරම්වලින් ධනය රැස්කර ගත් විශාල කණ්ඩායමක් විදේශ රටවලත් ඉන්නවා. ඒ අයගේ කළු සල්ලිත් සුදු කරගන්න ලංකාවට ගෙන ආ හැකියි. ඒ ධනය කොටස් වෙළඳපොළේ ආයෝජනය කරන්න පුළුවන්. ලෝකෙ කොතනක හෝ නීති විරෝධී වත්කම් තිබෙනවා නම්, ඒ ඒ රටවල නීති අනුව ඒවා ලංකාවට ගේන්න බැහැ. ලෝකයේ හැම රටක්ම එවැනි සම්මුතීන් අත්සන් කරලා තිබෙනවා. කළු සල්ලි උපයා ගත්තත් එම මුදල් තම රටට ගෙන ඒමට නොහැකි ලෙස ඒ රටවල නීති සම්පාදනය කර තිබෙනවා. ජාත්‍යන්තර සම්මුතීන්ට බැඳී ඉන්නවා. ඒ ජාත්‍යන්තර සම්මුතීන් අපි විසින් ආරක්ෂා කර ගත යුතුයි. ජාත්‍යන්තර හමුවලදී අපේ රට ප්‍රශ්න කිරීමට ලක් වෙනවා. රටක කීර්තියට, ප්‍රතිරූපයට අතිශය බලපෑම් ඇති කරනවා. රටක් ජාතියක් ලෙස වන්දි ගෙවීමට සිදුවෙනවා.

**සල්ලි සුදු කිරීමේ බලපෑම**

මේ වංචා කරනු ලැබ තිබෙන්නේ අපේ රටේ මහජනයාගේ ධනයයි. මේ හොරකම් කර තිබෙන්නේ අපේ රටේ පුරවැසියාගේ අනාගතයයි. අපේ රටේ දුවා දරුවන්ගේ අධ්‍යාපනයයි අපේ රටේ පුරවැසියන්ගේ සෞඛ්‍යයයි. ශිෂ්ට සම්පන්න රජයක් කළ යුතු වන්නේ ඒ හොරුන්ට දඬුවම් දීමයි. නමුත් අශිෂ්ට රජයක් කරන්නේ ඒ හොරකම් කළ දේපළ නීත්‍යානුකූල බවට කිරීමයි.

පාතාලකයන්ට කුඩු ව්‍යාපාරිකයාට නීත්‍යානුකූලභාවයක් ලැබෙනවා කියන්නේ නැවත නැවත අපරාධවල යෙදෙන්න පෙළඹවීමක් කිරීමයි. අපේ රට තුළ ගොඩනැගෙන්නේ, හොරකමට දිරිදෙන, වංචාවට, මත්ද්‍රව්‍ය ජාවාරමට, පාතාල කප්පම්වලට දිරිදෙන, දූෂණය අනුමත කරන, ඒවා ආරක්ෂා කරන, ඒවා නීත්‍යානුකූල කරන රාජ්‍යයක් නම් එවැනි රටකට කවර නම් ඉරණමක් අත්පත් කරදේවිද? මෙතන තිබෙනවා සමාජයේ යහපැවැත්ම පිළිබඳ ප්‍රශ්නය. මේ තීන්දුව මගින් සමාජය තුළ තිබෙන සාරධර්ම, සමාජය තුළ තිබෙන වගවීම, බැඳීම් සියල්ල අත්හරිනවා. අපේ සමාජය කළු සමාජයක් බවට පත්කරනවා. අපේ දුවා දරුවන්ට වඩාත් වැඩියෙන් කුඩු ව්‍යාප්ත වෙන, පාතාල ව්‍යාප්ත වන, අපරාධ වැඩිවන, හොරකම වැඩිවන, දූෂණය ව්‍යාප්ත වන රාජ්‍යයක් බවට පත්වෙනවා, කළු සමාජයක් බවට පරිවර්තනය කරනවා. යහපැවැත්ම, පොදු ගුණාංග සුණුවිසුණු කරන නීතියක් සම්පාදනය කිරීමට තරම් මේ පාලකයෝ අශිෂ්ට වුණේ කොහොමද? මෙවැනි අශිෂ්ට පාලකයෝ අපි නායකයන් ලෙස පිළිගත යුතුද?

ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ඒ ඒ අයට අදාළ ලිපි ගොනුවක් තිබෙනවා. ඒවා අධිකරණයට, නීතිපතිවරයාට, විගණකාධිපතිවරයාට, ආනයන අපනයන පාලකවරයාට, කොමිෂන් සභාවට පරීක්ෂණයට භාජනය කළ හැකියි. යම් ලිපිගොනුවක තම වත්කම් හෙළිදරව් කර තිබුණත් එය නීත්‍යානුකූලද නැත්ද යන්න අධිකරණයට, නීතිපතිවරයාට, විගණකාධිවරයාට, ආනයන අපනයන පාලකවරයාට, කොමිෂන් සභාවට පරීක්ෂණයට භාජනය කළ හැකියි. නමුත් මේ පනත කිසිදු වත්කමක් දේපළක් හෙළිදරව් නොකරන බවට "පරම රහස්‍යභාවය" ආරක්ෂා කරන බවට සඳහන් කරලා තිබෙනවා. එම රහස්‍යභාවය දෙපාර්තමේන්තු නිලධාරියෙක් හෝ කවුරු හෝ බණ්ඩනය කර තිබුණොත් රහස්‍යභාවය කඩකිරීම සඳහා දඬුවම්ද ඇතුළුව ඇති වගන්ති ක්‍රියාත්මක කිරීමට බැඳී ඉන්නවා.

මේ පනතේ ඊළඟ කොටස තමයි 2020 මාර්තු 31 දක්වා ගෙවීමට තිබුණු හිඟ බදු සියල්ල කපා දැමීමට යෝජනා කර තිබීම. ජාතිය ගොඩ නැගීමේ බද්ද වෙනුවෙන් (NBT) අය කළේ 3% යි. එය පුරවැසියන්ගෙන් අයකර ගත් බද්දක්. පුරවැසියා හා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී මේ බදු ගෙව්වා. ව්‍යාපාරිකයා ඒ බදු මුදල් එකතු කර ගත්තා. නමුත් ඒ බදු මුදල ආණ්ඩුවට ගෙව්වේ නැහැ. ඒ වගේම ඒ අදාළ පාරිභෝගිකයා ආර්ථික සේවා ගාස්තු (ESC) ගෙවා තිබෙනවා. නමුත් අදාළ ව්‍යාපාරිකයා ඒ මුදල් ආණ්ඩුවට ගෙවා නැහැ. ඒ මුදල් වංචා කරලා තිබෙනවා. එසේ නොගෙවූ බදු මුදල් කපා හැරීමට මෙම පනතින් යෝජනා කර තිබෙනවා. මේ වංචා කර තිබෙන්නේ භාණ්ඩාගාරයට ලැබිය යුතු ධනයයි. මේ බදු ගෙවීම පැහැර හැර තිබෙන්නේ, එක් චෞර ව්‍යාපාරික කණ්ඩායමක්. ඒ ව්‍යාපාරික කණ්ඩායමට මේ පනතින් සමාවක් දෙනවා. සාමාන්‍ය ව්‍යාපාරිකයා බදු ගෙවනවා. ඒ ව්‍යාපාරිකයන් ධෛර්යමත් කළ යුතුයි. හැබැයි ආණ්ඩුව එම ව්‍යාපාරිකයා අධෛර්යමත් කරනවා. වංචනිකයන්ගේ බදු කපා හරිනවා.

හොරු කණ්ඩායමක් අද රටක් අල්ලාගෙන තිබෙනවා. ඒ හොරු කණ්ඩායම කොවිඩ් වසංගත තත්වය තමන්ගේ ලාභ ප්‍රයෝජනයට යොදාගෙන තිබෙනවා. ආණ්ඩුව නීති සම්පාදනය කරන්නේ හොරු කණ්ඩායමක් වෙනුවෙන්. මෙවැනි කොවිඩ් වසංගත තත්වයක් හමුවේ පවා මේ පාලකයින් වැඩිපුර සැලකිල්ලට ලක්කරලා තිබෙන්නේ පොදු ජනතාවගේ ගැටලු ගැන නොවෙයි, තමන්ගේ ප්‍රශ්න පිළිබඳවයි. ඔවුන් නඩු ඉවත් කර ගත්තා. නඩු භාණ්ඩ නිදහස් කර ගත්තා. දැන් අනීතිකව උපයා ගත් ධනය නීත්‍යානුකූල කර ගැනීම සඳහා නීති සම්පාදනය කරගෙන තිබෙනවා.

**හොරකමට තිත තබන මඟ**

අපි පොදු ජනතාව එකතුවෙලා ආණ්ඩුවක් හදා ගනිමු. අපි මේ නීති වෙනස් කරනවා. මේ සුදු කරන ධනය උපයා ගත්තේ කෙසේද යන්න ජනතාවට හෙළිදරව් කරන නීති පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්නවා. පාර්ලිමේන්තුවේ සම්මත කිරීම ප්‍රමාණවත් නොවන බව ශ්‍රේෂ්ඨාධිකරණය කියනවා නම් ජනමත විමසුමකට යනවා. උපයා ගත්තේ කෙසේද යන්න හෙළිදරව් කළ නොහැකි නම් ඒ ධනය රාජසන්තක කරනවා. මේ අතලොස්සක් අත ගොනු වී තිබෙන්නේ අපේ රටේ සෞඛ්‍ය සේවයට, අධ්‍යාපනයට, ගොවි ජනතාවගේ ජීවිත නඟා සිටුවීමට, පොදු ජනයාගේ මූලික අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා වියදම් කිරීමට වුවමනා මුදලුයි. මේ සාපරාධී ක්‍රියාව අපි වැළැක්විය යුතුයි. ඒ වෙනුවෙන් අපි ඔබ සැමගෙන් ජනවරමක් බලාපොරොත්තු වෙනවා.

අපි ඔබගෙන් අහනවා. මේ විදිහට තවදුරටත් ගලා යාමට ඉඩදිය යුතුද? අපි ජනතාවට ආරාධනා කරනවා. ඔබටත් වගකීමක් තිබෙනවා. මේ පාලකයන් ඔබ විසින් පත්කර ගත්තේ ඔවුන් පිළිබඳව දැනගෙනයි. දැන් ඔබට තිබෙන වගකීමෙන් මිදෙන්න නම්, අපේ රට නව දිශාවකට යොමු කරන අලුත් දේශපාලන ගමන් මඟකට අප අවතීර්ණ විය යුතුයි. මේ ව්‍යසනයෙන් රට මුදා ගැනීම වෙනුවෙන් එකතු වන ලෙස අපි ඔබ සියලු දෙනාට ආරාධනා කරනවා.

# පොලිටිකල් පංතිය

පොලිටික්ක පංතියට පරක්කු වෙන අතරෙ ළමයි කම්මැලිකම යන්න අපූරු සෙල්ලමක් කරන්න පටන් ගත්ත. මේකෙ යෝජනාව ආවෙ කාගෙන්ද කියල හොයා ගන්නත් බැරි වුණේ එක එක්කෙනාගෙන් යෝජනාව ස්ථිර කිරීමේ අදහස් දක්වල ඉවර වෙනකොට සෑහෙන වෙලාවක් ගිය නිසා.

"එක්කෙනකුට කියන්න පුළුවන් එක බොරුවයි. කෙටියෙන් කියන්න ඕනෑ. උපරිම විනාඩි දෙකයි" මංජුව මෙහෙයවීම ස්වේච්ඡාවෙන් භාර ගෙන කොන්දේසි හදනව. "අහගෙන ඉන්න අයට ඕනෙමනං උපරිම ප්‍රශ්න දෙකක් අහන්න පුළුවන්... ඒවට උත්තර තනි වචනෙන් දෙන්න ඕනෑ"

"හරි පටන් ගන්න" මංජුව ඉස්සෙල්ලම අත උස්සපු චමියට කිවුව.

"ගෑස් සපයන්න, නල එලන්න ටෙන්ඩර් කැඳෙව්වෙත් නෑ. ටෙන්ඩර් නැතිව ඒවා ඇමරිකාවට දුන්නෙත් නෑ. කෙරවලපිටිය බලාගාරෙ වික්කෙත් නෑ. කළේ ආයෝජනයක් විතරයි. බැසිල් සර්ට මේවයින් මුකුත් ලැබුණෙත් නෑ" චමිය කලිසම් සාක්කු දෙක එළියට ඇදලම පෙන්නකොට අත්පුඩියක් ආවා.

"නැගෙනහිර ජැටියෙ බේරගන්න දෙයක් තිබුණෙ නෑ. වරායෙ ඉඩම් අක්කර 13ක් චීනෙට වික්කෙ නෑ. බටහිර ජැටිය ඉන්දියාවට වික්කෙත් නෑ." සුමිය ඇඟට නොදැනි කියල දැම්ම.

"මට ප්‍රශ්න දෙකක් අහන්න තියෙනව." සමන අත ඉස්සුව. "හරි අහන්න" මංජුව අවසර දුන්න. "දැන් ඔය වික්කෙ නෑ කියපුවගෙ අයිතිය ඒ රටවලට පැවරුවද?" "ඔව්" "ඒ වෙනුවෙන් සල්ලි ගත්තද?" "ඔව්" "එහෙනම් එච්චරයි" සමන හිනාවෙලා කිවුව.

"සුදුළූණුවලින් වංචාවක් වුණේ නෑ. මේකට ඇමතිවරුන්ගෙ කිසිම සම්බන්ධයක් නෑ. මාධ්‍යවේදියො බොරු ලිවුව. සීඅයිඩිය එපා කියද්දි මාධ්‍යවේදියො බලෙන් කටඋත්තර දෙන්න හැදුව" වසන්තිය කිවුවෙ ඇත්තම කියල හිතාගෙනද දන්නෙත් නෑ.

"බංගලාදේශයෙන් ණය ගත්තෙ නෑ. ඉන්දියාවෙන් ණය ඉල්ලුවෙ නෑ. කොටින්ම ඩොලර් අර්බුදයක් ඇත්තෙත් නෑ. කබ්රාල් මහ බැංකුවට ගියෙත් නෑ. නිලධාරි අයින් කලෙත් නෑ" අනුරුද්දියත් හරි හරියට තරගෙ.

"සීනි බද්ද අඩු කළෙත් නෑ. සීනි වැඩිපුර ගෙන්නුවෙත් නෑ. සීනි හැංගුවෙත් නෑ. සීනි මිල වැඩි කළෙත් නෑ. සජාත් සර්ව අඳුරන්නෙත් නෑ. සර් ෂැංග්‍රිලා එකේ රැස්වීම් තිබ්බෙත් නෑ" වැඩිපුර හැංගිලා ඉන්න බස්සාත් කොරවෙන්න වචනයක් දැම්ම.

"හාල් පාලනේට ගැසට් ගැහුවෙත් නෑ. හදිසි නීතිය දැම්මෙත් නෑ. හාල් වටලන්න ගියෙත් නෑ. රජයෙ මිලට හාල් දෙන්න මෝල්කාරයො දණ ගස්සල කැමති කරෝ ගත්ත.... කොටින්ම හාල් මිල වී මිලටත් වඩා බැස්ස" කනිය ජයග්‍රාහී විදිහට කියල ඉඳගන්නකොට පිටිපස්සෙන් අත්පුඩියකුත් ආවා.

"රට වැහුවා. රට ඇරියා. රට වැහුව. රට ඇරිය. රට වැහුවා. රට ඇරියා. රට වැහුව. රට ඇරිය. රට වැහුවා. රට ඇරියා. රට වැහුව. රට ඇරිය. රට වැහුවා. රට ඇරියා. රට වැහුව. රට ඇරිය... රට" තුසිතය තමන්ගෙ කතාව කෙටියෙන් කියන්න හැදුව.

"ඔයාගෙ කාලෙ ඉවරයි... ඉඳ ගන්න" මංජුවගෙ රැවිල්ල තමයි රැවිල්ල.

"එයා හරි... වැහුවා කිවුවට වැහුවෙත් නෑ. ඇරියා කිවුවට ඇරියෙත් නෑ" කවුරුහරි පස්සෙ ඉඳලා කියපු කතාවට කාගෙත් හිනා පැන්න.

"මාධ්‍යවලින් බොරුවට කෑ ගැහුවට මේ රටේ තියෙන්නෙ එක නීතියක්. ලොහාන් ඇමති බීලා බන්ධනාගාරෙට පැන්න. ගෝඨා සර් අයින් වෙන්න කියල එයාව ගෙදරම යැව්ව." තුසිය කිවුවෙ අතිනුත් දොර පෙන්නල.

"තාමත් ලොහාන් ඇමතිකමක් දරනව නේද? "ඔව්" "පාස්කු ප්‍රහාරෙ මහ මොළකරුවන්ට නඩු දැම්මද?" "නෑ" මංජුවගෙ ප්‍රශ්න දෙක ඉවර වුණා.

"ලෙඩ්ඩු විසි අටක් හිටිය කියල රට වහන්න පුළුවන්ද?... හැමෝම කියනව අර රටේ මෙහෙම කළා. මේ රටේ මෙහෙම කළා කියලා... මම තමයි හොඳටම කළේ!" මංජුවත් තරගෙට එකතු වුණේ හැක හැක හිනාවක් එක්ක.

"මට ප්‍රශ්නයක් තියෙනවා" සමන මංජුවට කිවුව. "එතකොට අන්තිමට රට වැහුව නේද?" "ඔව්" "ලෙඩ්ඩු ලක්ෂ පහක් පැනලා දහතුන්දාහක් මැරුණා නේද? "ඔව්"

"අඩුම ගාණෙ ඒ කතාවවත් බොරුවක් නොවී ඇත්තක් වුණානම්. අන්තිමට මේ වගේ රටම අඬවන ඇත්තක් වෙන්නෙ නැතුව" සමන කියල ඉවර වෙනකොට වගේ පොටික්ක හම් මල්ලත් අරන් කරබාගෙන පංතියට ඇතුල් වුණා. හැමෝටම තේරුණා එයා දොර ළඟට වෙලා සෙල්ලම අහගෙන ඉඳල තියෙනව කියල.

කවුළුව හැර තබමි

# රතු ඔක්තෝබරයේ පාඩම්...




අපේ යුගයේ සිදුවූ මහා ඓතිහාසික සිදුවීම මෙන්ම ශ්‍රේෂ්ඨ මානව ක්‍රියාදාමය රුසියාවේ ඔක්තෝබර් සමාජවාදී විප්ලවය බව ලොව සිටින සියලු වාමවාදීන් පිළිගන්නවාට සැකයක් නැත. නිර්ධන පංති විප්ලවයක් සාර්ථක වීමට නම් ප්‍රධාන සාධක හතරක් නිසි ප්‍රමිතියට අනුකලනය විය යුතු බව මාක්ස්-ලෙනින්වාදයේ ගුරුවරුන්ගේ නිගමනයයි. එනම් පංතිය, පක්ෂය, නායකත්වය හා වැඩපිළිවෙළයි. ඊට ක්‍රියාමාර්ග සහ උපායඋපක්‍රමද ඇතුළත් වේ. ලෙනින් ප්‍රමුඛ බොල්ෂෙවිකයන් මෙම සාධක හතර කෙරෙහි නිරන්තර සුපරීක්ෂාව පළ නොකළේ නම් අපට ශ්‍රේෂ්ඨ ඔක්තෝබරයක් ගැන කථා කළ හැකි වන්නේද නැත. අද ඒ ශ්‍රේෂ්ඨ විප්ලවයේ ඍජු ප්‍රතිඵලය මිහි තලය මත දක්නට නැත. නමුත් එය විසින් මතුකළ විප්ලවීය පාඩම් තව සියවස් ගණනක් යන තුරුම උගෙනීම සඳහා පවතිනු ඇත.

ඔක්තෝබර් විප්ලවයේ පාඩම් සම්පිණ්ඩනය කරමින් වරක් ට්‍රොට්ස්කි කළ ප්‍රකාශයක් මෙහිදී අපට සිහියට නැගේ. එය සමාජ විප්ලවයේදී පක්ෂයක හා එහි ක්‍රියාමාර්ග සම්බන්ධ විග්‍රහයකි.

"පක්ෂය යනු කුමක්ද? ඒකාබද්ධතාවය සමන්විත වන්නේ කුමකින්ද? ඒකාබද්ධතාවය යනු සිද්ධීන් හා කර්තව්‍යයන් පිළිබඳ පොදු අවබෝධයයි. මේ පොදු අවබෝධය යනු පක්ෂයේ ක්‍රියාමාර්ගයයි... පක්ෂයකට ක්‍රියාමාර්ගය එහි උපකරණය වෙයි. ක්‍රියාමාර්ගය නොමැති කල්හි එක් එක් කම්කරුවා සිය උපකරණය ක්ෂණ නිර්මාණ තනා ගත යුතුය. නැතහොත් ක්ෂණ නිර්මිත අවි සොයා ගත යුතුය. මෙහිද එක් අවියක් අනෙක් අවිය සමඟ පරස්පරව යයි. පොදු සංකල්පවල මහා පෙරමුණු බලඇණිය (පක්ෂය) සංවිධානය වී ඇති විටදී පමණක් අපට ක්‍රියාත්මක විය හැකිවෙයි."

ට්‍රොට්ස්කි ප්‍රශ්න කරන්නේ පංතිය, පක්ෂය, නායකත්වය හා වැඩපිළිවෙළ අන්‍යෝන්‍යව සම්බන්ධ නොවූ කල, එකිනෙකින් වියෝ වූ කළ හැකි විප්ලවය කුමක්ද යන්නය.

# මේක මරු රටක් ඕයි!...

බංගලාදේශයෙන් ණයක් ගත් විට පොහොට්ටුවේ එක දේශපාලුවෙක් කීවේ 'එය ණයක් නොව අත මාරුවක් බවයි. හැබැයි පොලියක්ද ගෙවිය යුතු බවයි'.

කෙළවරපිටිය බලාගාරය ඇමෙරිකාවට පවරා දීමේදී පංචායුධ දේශපාලුවා කීවේ 'එය දෙන්නේ ඇමරිකාවට නොව ඇමරිකානු සමාගමකට බවයි'.

ණය ගැනීමත්, විකුණං කෑමත් දැන් මේ ආණ්ඩුවේ ජීවන විලාසිතාව වී ඇත. ආණ්ඩුවේ දේශපාලුවෙක් එක පැත්තකින් දේශීය ආර්ථිකයක් හැදීමට කතාකරන අතර තව පැත්තකින් රටේ ජාතික සම්පත් ලෝකයාට විකුණාගෙන කමින් සිටී. ජනතාවට එකක් පවසා ඊට මුළුමනින්ම පටහැණි දේ කිරීම අපේ රටේ පහළ වූ හැම ධනපති ආණ්ඩුවකම, පාලකයකුගේම ජන්ම චර්යාවයි.

නැවත වටයකින් තම බල ව්‍යාපෘතිය සඳහා ජාතිවාදය, ආගම්වාදය අවුස්සමින් චෞර නිගන්ඨනාථ පුත්‍රයන් පාවඩ පිටින් වේදිකාවට වඩමවන ගමන් ගෝඨාභය ජනාධිපතිවරයා එක්සත් ජාතීන්ගේ සම්මේලනය අමතමින් රාජ්‍යතාන්ත්‍රිකව කියා සිටින්නේ නැවත කිසි විටෙකත් මේ රටේ ජාතිවාදය, ආගම්භේදය අවුස්සා රට ගිනි තැබීමට තමා කිසිසේත්ම ඉඩ නොතබන බවයි.

ශ්‍රේෂ්ඨ රුසියන් කවි ඇලෙක්සැන්ඩර් පුෂ්කින් සාර්ට




එරෙහිව රචනා කළ කවියක මෙසේ සටහන් වේ.

"එම්බා සැහැසි දුර්ජනය
පිළිකුල්ය මට තොපද
තොප යන මඟද..."

# භූත - දූපත...



රාජකීය වෛද්‍ය ඒලියන්ත වයිට් මහතා කොරෝනා වැළඳී මිය ගියේය. ඒ ගැන රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මෙසේ ශෝක පණිවුඩයක් මුදාහැර තිබුණි. එය කෙටියෙන් මෙසේය.

'මහින්ද රාජපක්ෂ මහතාගේ වෛද්‍යවරයා වූ ඒලියන්ත වයිට් මහතා ඉමහත් සේවාවක් ඉටු කළ අතර ඔහුගේ මරණය පිළිබඳව අපගේ බලවත් ශෝකය ප්‍රකාශ කරමු!'

මිය ගිය මිනිසෙකුට අපහාස කිරීම ශිෂ්ට සම්පන්න නොවේ. අපි සමාජයට ඉමහත් සේවාවක් කළා යැයි කියන්නේ විද්‍යාවෙන් ලොව බැබලවූ මිනිසුන්ට මිස මිත්‍යාවෙන් ලොව රැවටූ මිනිසුන්ට නොවේ. ජප මුට්ටි ගඟේ පා කර ලෙඩ සුවකරන මහත්වරු සහ විද්‍යාවෙන් ලෙඩ සුවකරන මහත්තුරු අතර වෙනස බලා ගැනීමටද ඉහත ප්‍රකාශ මගින් අවස්ථාව උදාවන බව අපේ අදහසයි.

රැවටිලිකාර දූෂිත පාලකයින්ට මිත්‍යාව අවශ්‍යය. මිත්‍යාවට මෝඩයින් අවශ්‍යය. පාලකයන්ට එම මෝඩයින් තනා දෙන්නේ විවිධ වර්ගයේ කෛරාටික අතරමැදියන්ය.

පාලන තන්ත්‍රයේ මුදුනේම සිටින අයවලුන් මිත්‍යාව කරපින්නා ගත්විට ඒ රටට අත්වන සැන්තෑසිය ගැන අමුතුවෙන් කිවයුතු නැත.

ඒලියන්ත වයිට් දොස්තර මහතාගේ මරණයෙන් නැවත නැවතත් තහවුරු වන්නේ මිත්‍යාවද විද්‍යාවද යන්න නැවත නැවතත් සිතිය හැකිය. රටක් නංවාලිය හැක්කේ විද්‍යාව ඇසුරු කරන්නන්ට මිස මිත්‍යාවේ වහලුන්ට නොවේ.

02 පිටුවෙන්..

## ඔළුගෙඩි මාරු කිරීමක් ...



නිවාඩ් කබ්රාල්ගේ පත්වීම එකතු වී තිබෙනවා. නෙළුම් මාවතේ පොදුජන පෙරමුණේ කටයුතු කරලා මහ බැංකු අධිපති පුටුවේ වාඩිවීම මහ බැංකුව දේශපාලන අණ්ඩක් බවට පත්කර ගැනීමක්. මේක රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව අර්ජුන් මහේන්ද්‍රන්ව දාලා මහබැංකුව මංකොල්ලකෑවට වඩා අමුතු දෙයක් නෙවෙයි. මෙය සිදු කෙරෙන්නේ රටේ දැවැන්ත මූල්‍ය අර්බුදයක්, ඩොලර් හිඟයක් සහ බරපතල ආර්ථික කඩාවැටීමක් තිබෙන පසුබිමකයි. රට බංකොලොත් වෙමින් යන වෙලාවක ආණ්ඩුව මූල්‍ය ක්ෂේත්‍රයත් සමග සෙල්ලම් කරන්න පටන් ගෙන තිබෙනවා. මෙය රටට සිදුකරන ඉතා බරපතළ අපරාධයක්.”

02 පිටුවෙන්..

## උතුරේ දුප්පත්කම



කියන ප්‍රශ්නයත් ජනතාවට තිබෙනවා. මේ නිසා මේ ජාවාරම් පිටුපස දේශපාලන බලවේග තිබෙන බව ජනතාවට පැහැදිලි වී තිබෙනවා.

කොරෝනාව විසින් ජනතාවගේ දරිද්‍රතාවය වැඩිකර තිබුණත් පොදුවේ ඊට වඩා ව්‍යසනයක් බවට දුප්පත්කම පත්වී ඇති බව තහවුරු වෙනවා. කාන්තා ගෘහ මූලිකාවන් සිටින පවුල් 28,000ක්, ආබාධිත 7,000ක් වගේ පිරිසක් උතුරේ ඉන්නවා. නමුත් මෙ අයට කොරෝනා සහනාධාර පවා ලැබෙන්නේ නැහැ. නමුත් ආණ්ඩුවේ මැති ඇමති පුතුන් උතුරට ගොස් මාධ්‍ය සංදර්ශන පවත්වනවා.”

## කොවිඩ් ප්‍රශ්න 10ට...

11 පිටුවෙන්..



විශ්වාසය වෙනතක යවා කෑගල්ලේ ධම්මික පැණිය වැනි ප්‍රවර්ධනය කරන්නට සෞඛ්‍ය අමාත්‍යාංශයේ රෝහල් භාවිත කරනු ලැබීය. එයට ආයුර්වේද දෙපාර්තමේනතුව ඇතුළු රාජ්‍ය ආයතනවල ලියාපදිංචිය ලබාදීමට බලපෑම් සිදුවිය. එවැනි ආකාරයේ ප්‍රචාරණයකට හවුල් වූ රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන්, පාර්ලිමේන්තුවේ ප්‍රධානීන් සහ ඇතැම් මාධ්‍ය ප්‍රධානීන් මේ පැණි කෝලමේ වගකීම භාර ගන්නේද?

04. සෞඛ්‍ය අමාත්‍යාංශය මැදිහත්වී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ප්‍රදේශ මගින් එන්නත්කරණය සිදු කරමින් පවතී. එවැනි තැන්වලට නියමිත ප්‍රමාණයට වඩා එන්නත් අඩුවෙන් ලබා දී හිතාමතා එම ප්‍රදේශවල තදබදයක් ඇතිකරමින් තිබේ. සෞඛ්‍ය අංශ සම්බන්ධව ජනතාව තුළ දෝෂදර්ශනයක් ඇතිකිරීමට සැලසුම් සහගතව ක්‍රියාත්මක වන බව පෙනේ. මේ එන්නත් හිඟය සම්බන්ධ ගැටුම් ඇති කිරීමට අදාළ තීන්දුව පැමිණෙන්නේ කොතැනකින්ද? එසේම ඇතැම් එන්නත් සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබා නොදීමටත් ඇතැම් එන්නත් සමහර ප්‍රදේශවලට ලබා නොදීමටත් අදාළ තීන්දු ගනිමින් සිටින්නේ කවුරුන්ද?

05. කොවිඩ් ආසාදිතයින් හා මරණ සම්බන්ධයෙන් දත්ත පිළිබඳව ගැටලුකාරී තත්වයක් පවතී. මෙම දත්ත වෙනස් කිරීම සම්බන්ධ චෝදනා එල්ල වී ඇත. ඉහළ හමුදා නිලධාරියෙක් සහ විශේෂඥ වෛද්‍යවරුන් දෙදෙනෙක් සම්බන්ධ බවට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් චෝදනා කර තිබුණි. මෙසේ චෝදනා එල්ල කරන ලද අයගෙන් සහ එල්ල වූ අයගෙන් අවම වශයෙන් ප්‍රකාශ ලබා ගෙන රටට නිවැරදි තොරතුරු ලබාදීමට ආණ්ඩුව කටයුතු කරන්නේද?

06. ඖෂධ නියාමන අධිකාරියේ දත්ත ගබඩාව හදිසියේ මැකී යාම සම්බන්ධයෙන් ගැටලුවක් සාකච්ඡා වෙමින් ඇත. එහි දත්ත ගොනු ලක්ෂ 11ක් අතුරුදහන් වී තිබේ. මෙය හුදු සෞඛ්‍යය පිළිබඳව පමණක් නොව රාජ්‍ය ආරක්ෂාව පිළිබඳවත් ගැටලුවකි. මේ සම්බන්ධයෙන් වගකීම භාර ගනු ලබන්නේ කවුද? ඔවුන් පිළිබඳව ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද? දත්ත හානිය නිසා ඖෂධ හා සෞඛ්‍ය මෙවලම් ලියාපදිංචිය ප්‍රමාද වී තිබේද? එය කොවිඩ් මර්දනය බලපා ඇත්තේ කවරාකාරයෙන්ද?

07. පීසීආර් හා රැපිඩ් අන්ටිජන් පරීක්ෂණවල මිල සම්බන්ධයෙන් ආන්දෝලනයක් ඇතිව තිබේ. ජනතාව ඒ වෙනුවෙන් විශාල මුදලක් වියදම් කරමින් සිටියි. මේවායේ මිල ගණන් සම්බන්ධයෙන් නැගෙන චෝදනා පිළිබඳව ලබා දෙන පිළිතුර කුමක්ද?

08. මේ වන විට පීසීආර් හා රැපිඩ් අන්ටිජන් පරීක්ෂණ දෛනිකව ලක්ෂයක පමණ ප්‍රමාණයක් සිදු කළ යුතුව තිබේ. නමුත් ඒවා සිදු කෙරෙන්නේ දෛනිකව 20,000ට ආසන්න ප්‍රමාණයකි. මෙම ප්‍රමාණය වැඩි නොකිරීමට හේතු කවරේද?

09. කොවිඩ් රැලි අනුව ඒ සම්බන්ධයෙන් වගකීම් දැරූ නිලධාරීන් මාරු වී ඇත. කොවිඩ් මර්දනයේදී ප්‍රමුඛතම කාර්යභාරයක් ඉටු කළ හා අත්දැකීම් ලැබූ සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන් ඉවත් කිරීමට තීන්දු ගනු ලැබුවේ කවුද?

10. මේ වන විට දකුණු අප්‍රිකානු ප්‍රභේදය පිළිබඳව අනතුරු හඟවනු ලැබ තිබේ. එසේ තිබියෙදී ඉන්දියානු සංචාරකයන් ඇතුළු විදෙස් සංචාරකයන් ගෙන්වීමට අදූරදර්ශී තීන්දුවක් ගනු ලැබුවේ කවුරුන් විසින්ද?

## විසඳුම ඇත්තේ...

04 පිටුවෙන්..



කිරීම. ප්‍රගතිශීලීන්ගේ ඒකාබද්ධ ප්‍රහාරයක් සඳහා ශක්තිමත්ව සිටීම වගේ මූලික කටයුතු වේගවත් කිරීමයි. ආණ්ඩුව ඇතුලෙ සහ පිට සිටින ප්‍රගතිශීලීන් එක්ව, ආර්ථික සහ දේශපාලන පරිවර්තනීය න්‍යාය පත්‍රයක් මත පදනම්ව බලයක් ගොඩනගා ක්‍රියාත්මක කළ යුතුයි. කාගෙ කාගෙත් වගකීම ඒ සඳහා නැගී සිටීමයි. කාල් මාක්ස් සහෝදරයා කිවුවනෙ සියලුම දාර්ශනිකයො ලෝකය විග්‍රහ කළත් කාරණය වන්නේ ලෝකය වෙනස් කිරීමයි කියලා. ඒ කියමන ලංකාව සම්බන්ධයෙන් ගලපා ගෙන විග්‍රහ කරගමු. වෙනස් කිරීමත් කරමු. ඒ දෙක එකට සම්බන්ධ කරගත්තොත් ඇතිවෙලා තියෙන විවිධාකාර අර්බුදයන්ට විසඳුමක් ලබාදීම සඳහා කළ යුත්තේ ජනතා ක්‍රියාකාරිත්වය ගොඩනගා ගැනීම පමණයි.

06 පිටුවෙන්..

## සංචිත අර්බුදය හමුවේ...




ඇති සීමිත භාණ්ඩයන්හි මිල ඉහළ යාම හා දැඩි භාණ්ඩ හිඟයක් ඇතිවීම වැළැක්විය නොහැකිය.

### වරායේ භාණ්ඩ හිරවීම

පොහොර මෙන්ම අද වනවිට ආනයනික කිරිපිටි ගෙන්වීමේ හැකියාවද සීමා වී ඇත. එයද ඩොලර් හිඟය නිසා ආණ්ඩුව ගනු ලැබූ තීරණයක ප්‍රතිඵලයකි. තම මව් රටේ සමාගම්වල ශාඛා ලංකාවේ පිහිටුවා ඇති කිරිපිටි සමාගම් කිහිපයකට පමණක් ආනයනය කිරීමට පෙර ඩොලර් පෙන්වීමේ ක්‍රමවේදයන් බැහැරව කිරිපිටි සැපයීමට හැකියාවක් තිබුණද දැන් ඒ සීමාවන්ද ඉක්මවා ගොස් ඇත්තේය. එම සමාගම්වලටද විකුණා අවසන් කළ මුදල් රුපියල් ලෙස මව් රටට යැවීමට නොහැකිය. ඔවුන්ටද රුපියල් ඩොලර් සඳහා හුවමාරු කළ හැක්කේ බැංකු පද්ධතියෙනි. නැතහොත් ඩොලර් සඳහා වන කළුකඩ වෙළඳපොළෙනි. ඒ නිසා ඉදිරියටත් ඩොලර් අර්බුදයට විසඳුමක් නොවන්නේ නම් සිදුවිය හැක්කේ තවදුරටත් කිරිපිටි, ගෑස්, ඉන්ධන, පමණක් නොව පරිප්පු, සීනි, අල, ළූණු දක්වාම පෝලිම දික්වීමය.

පසුගියදා අගමැතිවරයාගේ තර්ජනයයක් ලෙස කියා සිටියේ, වරායේ හිරවී ඇති අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වහා නිදහස් කරන ලෙසය. වරායේ හිරවී ඇත්තේ භාණ්ඩ ගෙන්වන ලද අයට ගෙවා නිදහස් කර ගැනීමට ඩොලර් නොමැති නිසා බව අගමැතිවරයාට කවුරුන් හෝ කියා දී ඇත්තේ පසුවය. ඒ නිසා එම භාණ්ඩ නිදහස් කිරීම වෙනුවෙන් ඩොලර් මිලියන 50ක් විදේශ සංචිතවලින් මුදාහැරීමේ තීරණයක් ගැනීමට පසුගියදා කැබිනට් මණ්ඩලයට සිදුවිය. දැන් ඒ ඩොලර් මිලියන 50 ඉපයීමේ ක්‍රමයක් නැත. අර්බුදය එතැනය.

### විසඳුම කබ්රාල්ද - අයි.එම්.එෆ්.ද?

මේ ආර්ථික අර්බුදයේදී ආණ්ඩුවට විසඳුමක් තියා පැලැස්තරයක්වත් නැති බව ඔප්පු කරන උදාහරණ පසුගිය කෙටි කාලයේදීද ඇති තරම් දකින්නට ලැබුණි. බැසිල් රාජපක්ෂ මුදල් ඇමති වූ විට ඛනිජ තෙල් මිල අඩු වන බවට කෑ ගැසූ ඇමතිවරුන් දැන් කෙඳිරියක්වත් නගන්නේ නැත. පොහොර නතර කර මහා කන්නය වනවිට දේශීය කාබනික පොහොර ඇති තරම් නිපදවන බව කියා පසුව කාබනික පොහොර පමණක් නොව, සහල් ටොන් ලක්‍ෂයක්ද ආනයනයට දැන් තීරණය ගෙන හමාරය. අජිත් නිවාඩ් කබ්රාල් මහ බැංකුවේ අධිපති වීමට රාජ්‍ය මුදල් ඇමතිකමෙන් ඉල්ලා අස්වන විට, මූල්‍ය අර්බුදයට ඇලඩින්ගේ පුදුම පහන පහළ වී යැයි සිතූ අයද දැන් නිහඬය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යාමද, ණය ප්‍රතිව්‍යූහකරණයට ලක්කර ගෙවීමේ ඉදිරි කාලයක් ලබා ගැනීමද යෝජනා හැටියට ඉදිරිපත් වී ඇත. සංචාරක කර්මාන්තය විදේශ ශ්‍රමිකයන් ඉපැයීම, ආනයන ආදායම් බිඳ වැටී ඇත.

ආර්ථිකය හැදීමට ඇති වැඩපිළිවෙළ දේශපාලනය හැදීමට ඇති වැඩපිළිවෙළේම කොටසක් ලෙස තේරුම් නොගෙන, මේ ජරාජීර්ණ දේශපාලන ක්‍රමය මෙලෙසම පවත්වා ගනිමින් ආර්ථිකය වෙනස් කළ හැකියැයි සිහින මැවීම තවදුරටත් පළක් නැත. අර්බුදයට කෙටි කාලීන විසඳුමක්, මධ්‍ය කාලීන හා දිගු කාලීන විසඳුම් ක්‍රමද රැඳී ඇත්තේ දේශපාලන ක්‍රමයේම වෙනසක් සහිතව මානව සහ ස්වභාවික සියලුම සම්පත් එකට ගෙන සැලසුම් කිරීමේ ක්‍රියාවලියක් තුළය. ඒ සඳහා කැපකිරීම, සීමා කිරීම, පරිත්‍යාගයන්, ජනතාවගෙන් ඉල්ලා සිටීමට පෙර ඒ සියල්ල කළ හැකි දේශපාලන නායකත්වයකට රටේ දේශපාලන බලය ලබා දිය යුත්තේය. පැලැස්තර නොවන විසඳුමක් සඳහා ආරම්භය තැබිය හැක්කේ ධෛර්යවන්ත තීරණයකින්ම පමණි.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20, පන්නිපිටිය පාර පැලවත්ත, බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




විදුලි, වරාය, තෙල් වෘත්තීය සමිති හමුවී ...



ක්‍රිකට් පාවාදීමේ ඇමති කතාවට එරෙහිව නීතිපතිට පැමිණිලි කර...



කිරිගොවි ජනතාව වෙනුවෙන් අරගල බිමට...



කුරුණෑගල හිරිපිටිය රෝහල පිළිසකර කරමින්...




ඉතාලියේදී සහෝදරත්වයේ දිනය සමරා...

## ජාතිවාදය ඇවිළීම සඳහා කලඑළි බසින කණ්ඩායම් පිළිබඳව අවබෝධයෙන් සිටින්න



**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්**
**ටිල්වින් සිල්වා සහෝදරයා**

ආණ්ඩුවට තමන්ට එරෙහිව ජනමතයක් ගොඩනැගෙන අවස්ථාවන්හිදී ඔවුන්ගේ පැරණි සෙල්ලම වන ජාතිවාදය මතුකිරීම නැවතත් ආරම්භ කර ඇති බව පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, පාලකයින්ගේ කොන්ත්‍රාත් ඉටුකරමින් ජාතිවාදය ඇවිළීම සඳහා කලඑළි බසිමින් සිටින කණ්ඩායම් පිළිබඳව අවබෝධයෙන් සිටින ලෙස ජනතාවට අවධාරණය කළේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 27වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදීය. මෙහිදී වැඩිදුරත් කරුණු දක්වමින් ඔහු මෙසේද පැවසීය.

"එක එක සේනා බැහැලා මුස්ලිම් ජනයාට එරෙහිව විශේෂයෙන් දැවැන්ත ජාතිවාදයක් ඇවිස්සුවා. බලයට පත්වුණාට පස්සේ ඒ ජාතිවාදී නඩ ඔක්කොම ඔළුව හංගා ගත්තා. ආණ්ඩුවේ අවශ්‍යතාවයට මුස්ලිම් මන්ත්‍රීවරුන්ගේ ඡන්ද ගන්නකොට මේ නඩ හිටියේ ඔළුව හංගාගෙනයි. 20වැනි සංශෝධනය සම්මත කරගෙන හදිසි නීතිය සම්මත කරගන්න මුස්ලිම් මන්ත්‍රීවරුන්ගේ ඡන්ද අරගෙන දැන් නැවතත් ජාතිවාදී නඩ එළියට බැහැලා ඉන්නවා. ජනාධිපතිවරයා එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇමතීම සහ ලංකාව තුළ ක්‍රියාත්මක වීම තුළ අපි පැහැදිලි වෙනසක් දකිනවා. කතෝලික ජනතාවට, කාදිනල්තුමාට එරෙහිව නැවත වෛරය ඇතිකරමින් ඉන්නවා. පාස්කු ප්‍රහාරය වෙලාවේ මුස්ලිම් විරෝධයක් ඇතිවී ගැටුමක් දක්වා යාම වළක්වන්න කාදිනල්තුමා විශාල වශයෙන් මැදිහත් වුණා. යුක්තිය ඉටුකරගන්න ක්‍රමයක් හොයාගමු කියලා කතෝලික ජනතාව තුළ තිබුණ පීඩනය නතර කළා. ඒ සම්බන්ධයෙන් එතුමාට අපේ ගෞරවයක් තියෙනවා. දැන් ජනාධිපති පත්වෙලා අවුරුදු දෙකකට කිට්ටු වුණත් පරීක්ෂණ අයාලේ යමින් තියෙනවා. වින්දිතයන්ට යුක්තිය ඉටුවුණේ නැහැ. මේ නිසා කාදිනල්තුමා ආණ්ඩුවට බලකරමින් ඉන්නවා. ඒ නිසා ආණ්ඩුව තමන් ළඟ හිටපු බලවේග එළියට දාලා කාදිනල්තුමාට පහර දෙනවා.

බලය වෙනුවෙන් ජාතිවාදය අවුළුවලා දෙමළ ජනතාව අමනාප කරගත්තා. මුස්ලිම් ජනතාව අමනාප කරගත්තා. දැන් කතෝලික ප්‍රජාවත් අමනාප කරගන්න යන්නේ. සෞභාග්‍යය කරා යනවා නම් සමගිය තියෙන්න ඕනෑ. නමුත් ආණ්ඩුව කරන්නේ මේ මොහොතේ තිබෙන ආර්ථික අර්බුදය සහ ආණ්ඩුවේ අසමගිකම වහගන්න ජාතිවාදය අවුස්සන එකයි. මේ නිසා අපි ජනතාවට අවධාරණය කරන්නේ ජාතිවාදය අවුස්සන්න කලඑළි බහින කණ්ඩායම් පිළිබඳව අවබෝධයෙන් ඉන්න කියලා. මේ අය රටට හෝ ජනතාවට ආදරය ඇති අය නෙවෙයි; පාලකයින්ගේ කොන්ත්‍රාත් ඉටුකරමින් ජනතාව භේද කරන අයයි. රට අගාධයට අරගෙන යාමට දායක වන අය බව අවබෝධ කරගෙන කටයුතු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. මේ තත්වය වෙනස් කිරීමට අපේ රටේ දේශපාලනය වෙනස් කළ යුතුයි. ඒ වෙනුවෙන් පෙළගැහෙන්න කියලා ජනතාවගෙන් ඉල්ලා සිටිනවා.

## බඩු මිල ඉහළ යාමේ වගකීම මුළුමනින්ම ආණ්ඩුව භාර ගත යුතුයි



**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම්**
**විජිත හේරත් සහෝදරයා**

කොරෝනා වසංගතය නිසා බැටකමින් සිටින ජනතාව මත ආණ්ඩුව බඩු මිලේ පීඩාවත් පටවා ඇතැයි ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, මිල ඉහළ යාමේ වැරැද්ද පුද්ගලික අංශයට පවරා ආණ්ඩුව ඇඟ බේරා ගැනීමට උත්සාහ කරන නමුත් එහි සම්පූර්ණ වගකීම ආණ්ඩුව විසින් භාර ගත යුතුව ඇති බව පෙන්වා දුන්නේය.

විජිත හේරත් සහෝදරයා මේ බව කියා සිටියේ පසුගිය 03වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවේදීය.

"බඩු මිල ඉහල යාම නිසා ජනතාවට පහර පිට පහර වැදිලා තිබෙනවා. සහල් මාෆියාව නිසා සිද්ධ වී තිබෙන්නේත් මේ තත්වයමයි. හාල් මැස්සෝ, කරවල, උළුහාල්, සබන්, දත් බෙහෙත් හැම දේකමත් මිල වැඩි වෙලා. ජනතාවට දරාගන්න බැරි ජීවන වියදමක් ඇති වී තිබෙනවා. වහාම ආණ්ඩුව මැදිහත් වී අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සාධාරණ මිලකට ලබාදිය යුතුයි. එසේ නොකර ගැසට් පිට ගැසට් ගහලා ජනතාව පීඩාවට පත් කිරීම වහාම නතර කරන්න කියලා අපි ආණ්ඩුවට බල කරනවා.

අද වෙලා තියෙන්නේ ජනතා ද්‍රෝහී වැඩ කරපු ගජ මිතුරු ව්‍යාපාරිකයන්ගෙන් ආණ්ඩුව සල්ලි දීලා සීනි තොගය මිලදී ගන්න එකයි. මෙ.ටො. ලක්ෂ ගාණක් ශත 25 සොච්චම් බද්දට ගෙනල්ලා ගුදම්වල තිබුණු සීනි ටික ආණ්ඩුව සල්ලිවලට ගත්තාම ඒ ව්‍යාපාරිකයන්ට ගජ වාසියි. ගැසට් එකෙන් කරලා තියෙන්නේ තවත් වාසියක් ගජමිතුරන්ට ලබාදීම පමණයි. සතොසෙන් දෙන බව ආණ්ඩුව කියනවා. පාරිභෝගික අවශ්‍යතාවයෙන් සතොසෙන් සපයන්න පුළුවන් 5% යි. ෆුඩ් සිටිවලින් 12%ක් විතර. ඉතිරි වෙළඳපොළම තියෙන්නේ සාමාන්‍ය අනෙකුත් වෙළඳපොළවල්. 83%ක පාරිභෝගික අවශ්‍යතා ඉටුකරගන්න වෙන්නේ පොදු වෙළඳපොළවලිනුයි. ඒ නිසා අද සතොස ඉදිරියේ පෝලිම් ගැහිලා ඉන්නවා. පැය ගාණක් පෝලිමේ ඉඳලා කොරෝනාත් හදාගෙන ගන්න හම්බ වෙන්නේ සීනි කිලෝ එකයි. සමහර තැන්වල පෝලිමේ ඉඳලා සීනි නැතිව එන්න වෙනවා.

මේ පීඩාව ආණ්ඩුව හිතාමතාම ජනතාව මත පැටවූ එකක්. ගජමිතුරන්ට හම්බ කරන්න සියල්ලම අයාලේ යන්න ඉඩ දීලා තියෙන්නේ. ඇත්තටම සිද්ධ කරලා තියෙන්නේ 'සහන දුන්නා, සීනි ගෙනාවා, හැංගුවා, මිල වැඩි කළා, ඇල්ලුවා, දැන් ආණ්ඩුව මිලදී ගන්නවා.' ආණ්ඩුවයි, ගජ මිතුරු ව්‍යාපාරිකයොයි දෙගොල්ලම එකතු වෙලා අන්දරේ සීනි කෑවා වගේ වැඩක් කර තියෙනවා. ආණ්ඩුවයි ගජ මිතුරොයි දෙගොල්ලම ගජරාමෙට සීනි කනවා. ජනතාවට අල්ලට සීනි ටිකක්වත් නැතිව කහට බොන්න වෙලා තිබෙනවා."

## කොවිඩ් ප්‍රශ්න 10ට ආණ්ඩුව තමන්ගේ ස්ථාවරය රටට කිව යුතුයි



**ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික**
**වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා**

පසුගිය වසර 1 1/2ක ආණ්ඩුවේ කොවිඩ් මර්දන වැඩසටහන සම්බන්ධයෙන් ජනතාවට ගැටලු ගණනාවක් පැන නැගී ඇති බව කියා සිටි ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා, ඒවායින් ප්‍රමුඛ ප්‍රශ්න 10ක් ආණ්ඩුව වෙත ඉදිරිපත් කරන බවත් ජනාධිපතිවරයා සහ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් මේ ප්‍රශ්න 10ට රටේ ජනතාවට පිළිතුරු දිය යුතුව ඇති බවත් අවධාරණය කළේය.

වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා ආණ්ඩුව වෙත මෙම ප්‍රශ්න යොමු කළේ පසුගිය 01වැනිදා ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය සාකච්ඡාවකදීය. එම ප්‍රශ්න පහත පරිදිය.

01. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2021 ජනවාරි 18 දින ඉදිරිපත් කරන ලද ජාතික එන්නත්කරණ සැලැස්ම හදිසියේ වෙනස් කර අවු. 60 වැඩි අයට එන්නත් ප්‍රමුඛතාව නොදීමට තීන්දු කළේ කවුද?

02. සයිනොෆාම් එන්නත සති 05ක් ප්‍රමාද කිරීම ගැන ජනාධිපතිවරයා ඇතුළු ආණ්ඩුව ඖෂධ නියාමන අධිකාරියේ නිලධාරීන්ට චෝදනා කරයි. එසේ ප්‍රමාද කිරීමට කටයුතු කළ ඖෂධ නියාමන අධිකාරියේ සහ විශේෂඥ කමිටුවේ නිලධාරීන් කවුද? ඔවුන් සම්බන්ධයෙන් මෙතෙක් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග කවරේද?

03. එන්නත් ආනයනය ප්‍රමාද කර, ඒ පිළිබඳ **10වැනි පිටුවට**


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.